# කාර්යසාධන වාර්තාව - 2025



**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

**(වැය ශීර්ෂ අංකය - 124)**

# පටුන



| අන්තර්ගතය | පිටු අංක |
|---|---|
| **පරිච්ඡේදය 01** | |
| ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 1-22 |
| **පරිච්ඡේදය 02** | |
| ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 23-53 |
| **පරිච්ඡේදය 03** | |
| වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 54-59 |
| ඇමුණුම I | |
| **පරිච්ඡේදය 04** | |
| කාර්ය සාධන දර්ශක | 60 |
| **පරිච්ඡේදය 05** | |
| තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 61-63 |
| **පරිච්ඡේදය 06** | |
| මානව සම්පත් පැතිකඩ | 64-69 |
| **පරිච්ඡේදය 07** | |
| අනුකූලතා වාර්තාව | 70-74 |

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 දැක්ම

සංවර්ධනයේ ප්‍රතිලාභ සමානව භුක්ති විඳින සුපෝෂිත සමාජයක්

### 1.2 මෙහෙවර

ග්‍රාමීය සංවර්ධනය වැඩි දියුණු කිරීම, සමාජ ආරක්ෂණය සහ ප්‍රජා සවිබලගැන්වීම සහතික කිරීම සඳහා සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

## 1.3 හැඳින්වීම, කාර්යයන් හා කර්තව්‍යයන්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) විසින් 2019 දී සිදු කරන ලද ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව, ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට 82.8 ක් ග්‍රාමීය සහ වතු ප්‍රදේශවල ජීවත් වෙති. එපමණක් නොව, ජනගහනයෙන් සෑම හය දෙනෙකුගෙන් එක් අයෙකු බහුමාන දරිද්‍රතාවයට මුහුණ පා ඇති අතර ඔවුන්ගෙන් සියයට 95.3 ක් ග්‍රාමීය සහ වතු ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වේ. නාගරික ප්‍රදේශ හා සසඳන විට දරිද්‍රතා ශීර්ෂ ගණක දර්ශකය, ග්‍රාමීය ප්‍රදේශවල සියයට 10 කින් සහ වතු ප්‍රදේශවල සියයට 27 කින් වැඩි වන අතර, අධ්‍යාපන අවස්ථා, යටිතල පහසුකම් සහ සේවා සඳහා ප්‍රවේශය මෙන්ම ශ්‍රම බලකායේ සහ සමාජ ක්‍රියාකාරකම්වල කාන්තා සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සහභාගීත්වය අඩු මට්ටමක පවතී. එපමණක් නොව, ග්‍රාමීය ප්‍රදේශවල පවතින සමාජ ආර්ථික ගැටලු එම ප්‍රදේශවල  සංවර්ධනයට හා සමාජ ව්‍යුහයට සැලකිය යුතු සෘණාත්මක බලපෑමක් ඇති කරයි.*

මනාව සැලසුම්කළ සමාජ ආරක්ෂණ පද්ධතියක් හඳුන්වාදීම තුළින් රටක මානව ප්‍රාග්ධනය හා ඵලදායීතාව ඉහළ නැංවීම, අසමානතාවය අවම කිරීමට මෙන්ම  දිළිඳු බවේ විෂම චක්‍රය අවසන් කිරීමටද  පිටිවහලක් වනු ඇත. ලෝක කම්කරු සංවිධානයේ නිර්වචනයට අනුව සමාජ ආරක්ෂණය යනු තනි  පුද්ගලයන්  හෝ පවුල් ඒකක සඳහා ජීවිත කාලය පුරාවට දිළිඳු බව හා අවදානම් තත්ත්ව වලින් ආරක්ෂාවීම වෙනුවෙන් ක්‍රියාත්මක ප්‍රතිපත්ති හා වැඩසටහන් වලින් සමන්විත පද්ධතියකි. ශ්‍රී ලංකාව තුළ විවිධ සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක වුවද රජය හරහා අන්තර්කරණයට පිවිසෙන ඒකාබද්ධ වැඩසටහන් සම්බන්ධීකරණය කරමින් පද්ධතියක් ආකාරයෙන් ක්‍රියාත්මකවීමේ අවශ්‍යතාව වර්තමානයේදී පැනනැගී ඇත.

එබැවින්, රටේ සංවර්ධනයට සැලකිය යුතු බලපෑමක් ඇති කරන ඉහත සඳහන් අභියෝග ජයගැනීම සඳහා "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්තියට අනුව, කිසිවෙකු හෝ කිසිදු ප්‍රදේශයක් අත්නොහැරෙන සංවර්ධන ක්‍රියාවලියක් තුළින් බහුමාන දරිද්‍රතාවය තුරන් කිරීමටත් ආන්තීකරණයට හා අවාසිදායක තත්වයට පත්වූ ප්‍රජාවගේ සමාජ සුබසාධනය තහවුරු කිරීමටත් පුළුල් වැඩසටහනක අවශ්‍යතාවයක් පවතී.
ඒ අනුව, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ තුළ තිරසාර සංවර්ධනයක් ප්‍රගමනය කිරීම, සමාජ ආරක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම සහ ස්වාධීන ප්‍රජාවක් ගොඩනැඟීම සඳහා ප්‍රජා සවිබල ගැන්වීම යන පැතිකඩ ආවරණය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2412/8 හා 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්‍ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය ලෙස ස්ථාපිත කොට ඇති අතර මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් විෂයයන්ට සහ අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
4. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන මූලාරම්භයන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම.
5. සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකරදීම.
7. මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
8. ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා හා තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබා දීම.
9. පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
10. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු.
11. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
12. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහය හා එක්ව කටයුතු කිරීමට හැකි වනසේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
14. වයෝවෘද්ධ තැනැත්තන් රැකබලාගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම.

රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය 2025.10.18 අංක 2458/65 දරණ ගැසට් පත්‍රය මඟින් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී ඇත.

**මෙම කාර්යාලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වශයෙන්,**

1. රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය
2. රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම

3. රාජ්‍ය නොවන සංවිධාන සඳහා පහසුකම් සැපයීම
4. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන වෙත වීසා නිර්දේශ ලබාදීම
5. රාජ්‍ය නොවන සංවිධානවල විෂමාචාර හැසිරීම් වලට එරෙහිව ක්‍රියා කිරීම

සඳහන් කල හැකිය.

- ඉහත කාර්යය හා කර්තව්‍යයන් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ඉටුකරගැනීම සඳහා පහත සඳහන් දෙපාර්තමේන්තු, ආයතන හා අංශ සක්‍රීයව ක්‍රියාත්මක වේ.

### ❖ ග්‍රාමීය සංවර්ධන අංශය

i. ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය (RDB)
ii. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

### ❖ සමාජ ආරක්ෂණ අංශය

iii. සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)
iv. ආබාධ සහිත තැනැත්තන් සඳහාවන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය (NSPD)
v. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහජාතික මහ ලේකම් කාර්යාලය (NSE)
vi. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)
vii. උපදේශන අංශය
viii. ලෝක ආහාර වැඩසටහන් සහයෝගිතාව සඳහා වූ හවුල්කාරිත්ව ලේකම් කාර්යාලය
ix. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

### ❖ ප්‍රජා සවිබලගැන්වීම් අංශය

x. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)

### ❖ අධ්‍යාපනික ආයතනය

xi. ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

වර්තමානයේ මෙම ආයතන මගින් සේවා ලබාගන්නා ප්‍රධාන ඉලක්කගත කණ්ඩායම් පහත පරිදි වේ.

- වැඩිහිටි ප්‍රජාව මිලියන 3.9 (රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව, 2025)
- අවුරුදු 5ට වැඩි ආබාධ සහිත ප්‍රජාවක් මිලියන 0.73 (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2024)

- මිලියන 4.5ක අවිධිමත් අංශයේ සේවා නියුක්ත වූ ප්‍රජාව (ශ්‍රම බලකා සමීක්ෂණය, 2024)
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් 152,979 (පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, 2022)
- මානසික සෞඛ්‍ය ආබාධ සහිත ප්‍රජාව මිලියන 0.8 (සෞඛ්‍ය අමාත්‍යාංශය, 2017)
- බන්ධනාගාරගතවූ පුද්ගලයන්ගේ පවුල් 28,500 (ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව, 2024)
- තනි මා පිය පවුල් හා නිවාස අහිමි යාචක පුද්ගලයන්


ඒ අනුව , අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වැය ශීර්ෂ අංක 124 යටතේ ක්‍රියාත්මක වන අතර සමාජ සේවා දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 216 යටතේ ද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 331 යටතේ ද ක්‍රියාත්මක වේ.මෙම කාර්ය සාධන වාර්තාව මඟින් වැය ශීර්ෂ අංක 124ට අදාළ ප්‍රගතිය දැක්වේ.

**සැලකිය යුතුයි -** රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය අප අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වුයේ 2025 ඔක්තෝම්බර් මස බැවින් 2025 වර්ෂයේ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංකය යටතේ ක්‍රියාත්මක නොවූ බැවින් එම ආයතනයට අදාළ ප්‍රගතිය මෙම කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කළ නොහැක.

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් 2025 වර්ෂයේ දී ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ (HIES) දත්ත මේ වන විට විශ්ලේෂණය කරමින් පවතින අතර 2026 වර්ෂයේ අගභාගයේ දී සමීක්ෂණ වාර්තාව නිකුත් කිරීමට නියමිතය.

## 1.4.1 සංවිධාන සටහන

### ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය



## 1.5 අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු/ආයතන හා අංශ

## සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය සහතික කිරීම අරමුණු කොටගෙන, ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා සෑම දිළිඳු පුද්ගලයෙකු තුළම පවතින සැඟවුණු විභවතාවන් යටපත් කරගෙන ඇති බාධක දුරලමින්,එම පවුල් සවිබලගැන්වීම, සමාජ ආරක්ෂණය සහ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 අංක 2 දරනදිවිනැගුම (සංශෝධිත) පනතින්සංශෝධිතහා 2013 අංක 1 දරන දිවිනැගුම පනත මඟින් ස්ථාපිත කරඇත.

### අරමුණු

- අඩු ආදායම්ලාභී පවුල් ආර්ථික,සමාජීය හා මානසික යන අංශයන්ගෙන් බලගන්වා තිරසර හා උසස් ජීවන මට්ටමක් අත්කරගත් පවුල් ඒකක බවට පත් කිරීම.
- අඩු අදායම්ලාභී පවුල්වල සමාජ ආරක්ෂණය සහතික කිරීම.

### කාර්යභාරය

- 2025 සිට 2029 දක්වා වසර 05ක කාලය තුළ, බහුමාන දරිද්‍රතාවයට මුහුණදී ඇති පවුල් මිලියන 2ක් ආර්ථික, සමාජීය හා මානසික යන අංශ යටතේ සවිබලගැන්වීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් උත්පාදන මාර්ග හා ජීවනෝපාය මාර්ග නගාසිටුවීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල සමාජ සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

# සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)

## හැඳින්වීම

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේපත් කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින ආන්තිකරණයට හා අවාසිසහගතතත්ත්වයට පත් රටේ ජනකොටස්වලට වඩාත් යහපත් වටපිටාවක් ගොඩනැගීමේ අරමුණින් සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපිත කොට ඇත.

වර්තමාන රජයේ කිසිවෙකු හෝ කිසිදු ප්‍රදේශයක් අත් නොහැරෙන වරප්‍රසාද නොලත්, රටේ සමස්ත ප්‍රජාව වෙනුවෙන් උපතේ සිට මරණය දක්වා ක්‍රියාත්මක වන අන්තර්කරණීය සමාජ ආරක්ෂණ වැඩසටහනක් 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

එහිදී, අමාත්‍යාංශය යටතේ සමාජ සවිබලගැන්වීම හා අන්තර්කරණය සම්බන්ධයෙන් ජාතික මට්ටමෙන් ප්‍රමුඛ ආයතනය ලෙස කටයුතු කරන සමාජ සේවා දෙපාර්තමේන්තුව ආන්තිකරණය හා අවාසි සහගත තත්ත්වයට පත් ප්‍රතිලාභීන් සඳහා සකස් කරන ලද පුනරුත්ථාපන සැලසුම් අනුව සමාජ ආරක්ෂණ හා සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

## අරමුණු

- ආබාධ සහිත තැනැත්තන් ඇතුළු අනෙකුත් ආන්තිකරණයට හා අවාසි සහගත තත්වයන්ට පත් වරප්‍රසාද නොලත් ප්‍රජාවගේ සමාන අයිතිවාසිකම්, අවස්ථා, නිදහස හා සමාජ ආරක්ෂාව තහවුරු කිරීම.
- ආබාධ සහිත තැනැත්තන් සඳහා ආදායම් උත්පාදනයට ප්‍රවේශ සැපයීම තුළින් ඔවුන්ගේ ජීවන තත්වය උසස්කිරීම.

## කාර්යභාරය

- සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන තුළින් ආබාධ සහිතතරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම
- ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය ක්‍රියාකාරකම් නව තාක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් පවතින වෙළඳ පොළට සරිලන පරිදි සංවර්ධනය කිරීම.
- ආබාධ සහිත සහිත ළමුන් සඳහා කල්තියා මැදිහත්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් සමාජගත කිරීම

- දෙමාපිය භාරකරුවන් අහිමි ආබාධ සහිත පුද්ගලයන් සඳහා පූර්ණ කාලීන නේවාසික රැකවරණයලබාදීම හා සවිබලගැන්වීම
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගතකිරීම
- දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ කටයුතු සිදු කිරීම
- අබාධ සහිත දරුවන් සඳහා දිවා සුරකුම් මධ්‍යස්ථාන හරහා දිවා කාලයේ රැකවරණය හා පූර්ව වෘත්තිය කුසලතා සංවර්ධනය කිරීම
- ප්‍රජා මූලික පුනරුත්ථාපන ක්‍රියාවලිය ශක්තිමත් කර ප්‍රචලිත කිරීම සඳහා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමෙන් මෙහෙයුම් කමිටු හරහා අධීක්ෂණය වන ස්වශක්ති සංවිධාන මඟින් පුනරුත්ථාපන සැලසුම් හරහා සේවාදායකයන් සවිබලගැන්වීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- සංඥා භාෂා පරිවර්තන සේවය ලබාදීම
- රිදියගම නිවර්තන නිවාසය හරහා යාචකයින් පුනරුත්ථාපනය කිරීම

# ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSPD)

## හැඳින්වීම

ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවා ඇත. ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව මගින් ගන්නා වූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම හා ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර පරිසරයක් උදාකරදීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය මඟින් සිදුකරයි.

## අරමුණු

- ආබාධ සහිත පුද්ගලයන් සඳහා හිතකර පරිසරයක් ගොඩනැගීම
- ආබාධ සහිත පුද්ගලයන්, ඔවුන්ගේ කුටුම්භ සහ ප්‍රජාවන් ස්වශක්තියෙන් හා ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතුව ඔවුන් සමාජීය සහ ආර්ථික වශයෙන් නගාසිටුවීම සඳහා බලගැන්වීම
- සැමට සමාන අයිතිවාසිකම්, අවස්ථා, නිදහස හා සමාජ ආරක්ෂාව සහතික කිරීම.

## කාර්යභාරය

- ආබාධ සහිත තැනැත්තන් සුභසාධනය ප්‍රවර්ධනය කිරීම හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයන්ගේ මූලික අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ට සෞඛ්‍යය,අධ්‍යාපනය, රැකියා අවස්ථා සහ ප්‍රවේශ පහසුකම් සඳහා අවස්ථා පුළුල් කිරීම

# වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSE)

## හැඳින්වීම

2011 අංක 05 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

## අරමුණු

- වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම
- වැඩිහිටි තැනැත්තන්ගේ කායික හා මානසික සමතුලිතතාවය සහ නිරෝගීභාවය පවත්වාගෙන යාම හා සුභසාධනය ප්‍රවර්ධනය කිරීම
- වැඩිහිටි තැනැත්තන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම

## කාර්යභාරය

- වැඩිහිටියන්ට රැකවරණය, ආරක්ෂාව හා සුභසාධනය ලබාදීම පවුල තුළින්ම ඉටුකළ යුතු කාර්යභාරයක් බවට සමාජය දැනුවත් කිරීම.
- වැඩිහිටියන් රැක බලා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා වැඩි කිරීම.
- වැඩිහිටියන්ගේ හැකියාවන්, කුසලතා සංවර්ධනය මඟින් ආදායම් උත්පාදන මාර්ගයන්ට යොමු කරවීම.
- දැනුවත්භාවය වර්ධනය කිරීම තුළින් විශ්‍රාම දිවිය තුළ මුහුණ දෙන ගැටළු මඟහැරවීමට සුදානම් කිරීම.
- පිහිටක් අවැසි වැඩිහිටියන් සඳහා රැකවරණය සැලසීම.

# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)

## හැඳින්වීම

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මඟින් හා 1999 අංක 33 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධිත) පනත මඟින් ස්ථාපිතව ක්‍රියාත්මක වන ආයතනයකි. රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වේ.

## අරමුණු

- ස්වයං රැකියාවල නියුතු තැනැත්තතන්ට ඔවුන්ගේ වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකට පත් වූ විට සමාජ ආරක්ෂණය සැලසීම සහ ඔවුන් මියගියවිට ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම.
- තරුණ තරුණියන් ස්වයං රැකියාවල යෙදන ලෙස දිරිමත් කිරීම, ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් වැඩිදියුණු කිරීම සහ ජීවන තත්වය වැඩි දියුණු කිරීම

## කාර්යභාරය

ධීවර හා කෘෂිකාර්මික අංශවල සේවයේ නියුතු අය හැර වෙනත් ස්වයංරැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ ඒ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම 2024 වර්ෂය දක්වා ක්‍රියාත්මක කරන ලද කාර්යභාරය වූ අතර රජයේ සියලුම අංශවල ශ්‍රමිකයන්ට අදාල වන පරිදි විශ්‍රාම වැටුප් පිළිබඳ පුළුල් ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම සහ සෑම පුරවැසියෙකුම විශ්‍රාම වැටුප් ක්‍රමයකට සම්බන්ධවීමට දිරිමත් කිරීම යන නව රජයේ ප්‍රතිපත්තියට අනුව යමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම ආයතනයේ කාර්යභාරය වේ.

# ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

## හැඳින්වීම

1992 අංක 41 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත වූ මෙම ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 ඒ වගන්තිය යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇති අතර සමාජ වැඩ (Social Work) පිළිබඳව අධ්‍යාපනය ලබාදෙන ශ්‍රී ලංකාවේ ඇති එකම රාජ්‍ය ආයතනය වේ.

ආයතනයේ කේන්ද්‍රීය අංශය වන පාලක සභාව (Governing Council)මගින් ආයතනයේ පරිපාලනය, කළමනාකරණය හා මූල්‍යමය කටයුතු සම්බන්ධව ක්‍රියාකරනු ලබයි. පාලක සභාව යටතේ ක්‍රියාත්මක අධ්‍යයන කටයුතු මණ්ඩලය (Academic Affairs Board) ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා වන උපදෙස් හා මග පෙන්වීම් ලබා දීම සිදු කරයි.

## අරමුණු

- ගෝලීය අවශ්‍යතාවයන්ට සහ නව නිපැයුම් සමඟ සමපාත වන නව්‍යකරණ අධ්‍යාපනය හා වෘත්තීය නිපුණතා වැඩිදියුණු කිරීම සහ වෘත්තීය සංවර්ධනය පෝෂණය කිරීම.
- තිරසාරභාවය සහ සමාජ සාධාරණත්වය පෝෂණය කරන සමාජ සංවර්ධන ක්‍රමෝපායයන්ගේ භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- සමාජ සුබසාධනය සහ සංවර්ධන ප්‍රතිඵල වැඩිදියුණු කරන ප්‍රතිපත්ති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීමට පදනම් වන සමාජ ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සහ විශේෂඥ උපදේශන සේවා සැපයීම.

## කාර්යභාරය

- සමාජ වැඩ වෘත්තියවේදි අධ්‍යාපනය ලබාදීම.
- සමාජ වැඩ උපාධි පශ්චාත් උපාධි පවත්වා ගෙන යාම හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ නව උපාධි පාඨමාලා ආරම්භකිරීමට කටයුතු කිරීම. (සමාජවිද්‍යා විශේෂ උපාධිය, මානව විද්‍යා විශේෂ උපාධිය,මනෝවිද්‍යා හා උපදේශන විශේෂ උපාධිය හා වෘද්ධ විද්‍යා විශේෂ උපාධිය)
- සමාජ වැඩ පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්වීම.
- සමාජ වැඩ සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම හා ප්‍රකාශන පළ කිරීම.
- සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්වීම.
- සමාජ සුභසාධන කටයුතු වල නියැලි සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තිය කුසලතා වැඩි දියුණු කිරීම.

# ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය (RDB)

## හැඳින්වීම

2025 පෙබරවාරි මස 10 දිනැති හා අමප/25/0150/820/004 අංක දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය පිහිටුවා ඇත.

## අරමුණු

- වඩා යහපත් ජීවන තත්ත්වයක් ඇති කිරීම සඳහා ග්‍රාමීය පවුල්/ප්‍රජාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම
- ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම සහ ධාරිතා හා කුසලතා සංවර්ධනය කිරීම
- මූලික පහසුකම් (යටිතල පහසුකම් හා සේවා) උදෙසා වන ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම
- සමාජ සංවර්ධනය මඟින් සමාජ ගැටලු අවම කිරීම

## කාර්යභාරය

- ප්‍රජා ශක්ති දිළිඳු බව තුරන් කිරීමේ ව්‍යාපාරය යටතේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී රජයේ අමාත්‍යාංශ හා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම
- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු සිදු කිරීම
- ග්‍රාමශක්ති වැඩසටහන හා සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන තවදුරටත් සම්බන්ධීකරණය කිරීම

# ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

## හැඳින්වීම

1974 වර්ෂයේදී ආරම්භ වූ මෙම ආයතනය, 1978 වර්ෂයේ සිට ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමේ ක්‍රමෝපායක් ලෙස, සංවර්ධන ප්‍රවාහයෙන් ආන්තීකරණයට ලක්වූ දිළිඳු ප්‍රජාවගේ විභව ශක්තීන් මතු කරමින් ඔවුන්ගේ ස්වශක්තිය හා සාමූහිකත්වය වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව සංවර්ධන සංකල්පය මත පදනම්වූ විපර්යකාරක කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන තුළින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වා දුන් ජාතික ආයතනයකි. දිළිඳු ප්‍රජාවගේ සමාජ ආර්ථික ක්‍රියාවලිය තුළ ඔවුන් මුහුණපාන අවාසිදායක තත්ත්වය, වඩා වාසිදායක තත්වයක් බවට පරිවර්තනය කරගැනීමට අවශ්‍ය බලගැන්වීමේ උත්ප්‍රේරණ ක්‍රියාවලිය මෙම ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරයකි.

## අරමුණු

- ප්‍රජා සංවර්ධනය පිළිබඳ දැනුම කළමනාකරණය කිරීම.
- ප්‍රජා සංවර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම

## කාර්යභාරය

- ප්‍රජා සංවර්ධනය පිළිබඳ විද්වත් හා විශේෂඥ දැනුම සමාජ ගත කිරීම
- පවුල් හා ප්‍රජා මූල සංවිධාන සවිබලගැන්වීමට සෘජුව සම්බන්ධ වන පරිදි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- ප්‍රතිපත්ති සම්පාදකයින් /සංවර්ධනවේදීන් සඳහා තොරතුරු  සම්පාදනය.
- ප්‍රජා ශක්ති ජාතික ව්‍යාපාරයේ පුහුණු මධ්‍යස්ථානය ලෙස, බහුමාන දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ප්‍රජා සංවර්ධන සභාවල (CDC) ධාරිතාව වර්ධනය කිරීමට ආයතනය කැපවී සිටී. ඒ අනුව ප්‍රජා සංවර්ධන සභා නියෝජිතයන් පුහුණු කිරීම 2026 වර්ෂයේ මෙම ආයතනයේ ප්‍රධාන වගකීමයි.  තවද, ග්‍රාමීය දත්ත විද්‍යාත්මකව පර්යේෂණය කරමින් ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය තාක්ෂණික සහ බුද්ධිමය සහාය ලබා දීම ද ආයතනය සතු සුවිශේෂී කාර්යභාරයකි.

# උපදේශන අංශය

## හැඳින්වීම

ප්‍රජාව මුහුණපාන මානසික ගැටළුකාරී තත්වයන්, මානසික අසමතුලිතතා හා විවිධාකාර මනෝ සමාජීය ගැටලු සඳහා, මනෝවිද්‍යාත්මක උපදේශන හා ප්‍රතිකාරාත්මක ක්‍රමවේද භාවිතා කරමින් මානසික යහපැවැත්ම ගොඩනැගීම මෙම අංශය මඟින් සිදු කරයි.

## අරමුණු

- ප්‍රජාව මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරුවීම අවම කිරීම තුළින් මානසික යහපැවැත්ම ගොඩනැංවීම හා මානසික සවිබලගැන්වීම

## කාර්යභාරය

- පුද්ගලයින් මුහුණපාන මානසික ගැටළුකාරී තත්වයන්, මානසික ආබාධ, මානසික ලෙඩ රෝග හා විවිධාකාර මනෝසමාජයීය ගැටළු හඳුනාගෙන එම තත්වයන් අවම කිරීමට අදාළ උපදේශන වැඩසටහන් සිදු කිරීම.
- ප්‍රජාව මානසිකව සවිබලගැන්වීම සඳහා මනෝවිද්‍යාත්මක උපදේශන මැදිහත්කරණය සිදුකිරීම
- මානසික ආබාධ හා මානසික ගැටළු සහිත සේවාලාභීන් සඳහා ගුණාත්මක උපදේශන සේවාවක් සැපයීම.
- උපදේශන සේවයේ නියුතු වෘත්තිකයන් අතර විධිමත් සහසම්බන්ධතාවයක් ඇති කිරිම.
- උපදේශන සේවා ලබාදීම පිළිබඳ අධීක්ෂණය හා මඟපෙන්වීම.

# ලෝක ආහාර වැඩසටහන් සහයෝගීතාව සඳහා හවුල්කාරිත්ව ලේකම් කාර්යාලය

## හැඳින්වීම

ලෝක ආහාර වැඩසටහන (WFP) 1968 සිට ශ්‍රී ලංකාවේ ස්ථාපිත රාජ්‍ය අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක වන වැඩසටහනකි. 2023-2027 උපාය මාර්ගික සැලැස්ම යටතේ මේ වන විට ශ්‍රී ලංකාව තුල ලෝක ආහාර වැඩසටහන සාර්ථකව ආහාර සුරක්ෂිතතාව මූලික කරගනිමින් ක්‍රියාත්මක වේ. මෙම උපාය මාර්ගික සැලැස්ම ඇමරිකානු ඩොලර් මිලියන 105 ක මුළු වටිනාකමක් සහිත පස් අවුරුදු වැඩසටහනක්වන අතර, හදිසි ආපදා තත්වයන් සඳහා ප්‍රතිචාර දැක්වීම, ආන්තික පිරිස සඳහා ආහාර සහ පෝෂණ අවශ්‍යතා සැපිරීම, දේශගුණික විපර්යාස සඳහා දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සහ ආයතනික ධාරිතාවය ගොඩනඟමින් තිරසර සංවර්ධනය සඳහා අවධානය යොමු කරයි.

ඉහත කී අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා 2025 ජනවාරි 01 දින සිට WFP සහයෝගීතාව සඳහා වූ හවුල්කාරිත්ව ලේකම් කාර්යාලය (PSWFPC), ග්‍රාමීය ජන ජීවිතයේ ගුණාත්මය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් වඩාත් සුමටව ක්‍රියාත්මක වීම උදෙසා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙම ලේකම් කාර්යාලය, ලෝක ආහාර වැඩසටහන (WFP) සමඟ ශ්‍රී ලංකා රජය සම්බන්ධීකරණය සිදු කරන ප්‍රධාන මධ්‍යස්ථානය වන අතර, අදාල වැඩසටහන් බිම් මට්ටමින් ජාතික ප්‍රමුඛතා අනුව පෙළගැස්වීම, කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, වගවීම, විනිවිදභාවය සහ ඵලදායී අධීක්ෂණය තහවුරු කරයි.

2025 වර්ෂය සඳහා, උපාය මාර්ගික සැලැස්මේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා WFP වාර්ෂික ප්‍රදාන සහාය රුපියල් මිලියන 1,250 ක් වන අතර, ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම, ආන්තික ජනතාවගේ පෝෂණය වැඩි දියුණු කිරීම සහ ආපදා සඳහා ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් රුපියල් මිලියන 550 ක දායකත්වයක් 2025 වර්ෂය සඳහා සපයා දී ඇත.

## ප්‍රධාන උපායමාර්ගික ප්‍රතිඵල

1. අර්බුද සඳහා ප්‍රතිචාරය: අර්බුද අතරතුර සහ පසුව අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට ආහාර සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීම.

2. වැඩිදියුණු කළ පෝෂණය: පෝෂණ සංවේදී සහ පෝෂණ-විශේෂිත වැඩසටහන් හරහා ජීවිතයේ පළමු දින 8,000 කෙරෙහි අවධානය යොමු කරමින් පෝෂණය වැඩි දියුණු කිරීම.

3. ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම: ස්වාභාවික උපද්‍රව සහ දේශගුණික විපර්යාස සඳහා ප්‍රජා අවදානම අඩු කිරීම.

4. ආයතනික ශක්තිමත් කිරීම: ඔරොත්තු දෙන ආහාර පද්ධති සංවර්ධනය කිරීම සහ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා ජාතික ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම.

## පාලන අංශය

අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන වල මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සඳහා ආයතන රෙගුලාසි, චක්‍රලේඛවලට අනුකූලව හා අවස්ථානුකූලව කටයුතු කිරීම සඳහා පාලන අංශය ක්‍රියාත්මක වේ. පාලන අංශය මගින් පහත සඳහන් කාර්යයන් සිදුකරමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන හා අංශවලට කාර්යක්ෂම සේවාවක් ලබාදෙයි.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් සියළුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාළ ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම.
- දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම.
- අමාත්‍යාංශ විෂය පථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ,පනත්, කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරීම මගින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම.
- අවශ්‍ය මානව සම්පත් හා යටිතල පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.

## සංවර්ධන අංශය

මෙම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු ආයතන හා අංශයන්හි අරමුණු ළඟාකර ගැනීම සඳහා උපදෙස් ලබාදීම, මඟ පෙන්වීම හා මෙහෙයවීම සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.
එහිදී ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්ව ය සහ ආර්ථික යහපැවැත්ම වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියට අදාලව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ආයතන අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන) මගින්ද සමාජ ආරක්ෂණය අවැසි පුද්ගලයන් සඳහා හඳුනාගත් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ආයතන අතිරේක ලේකම් (සමාජ ආරක්ෂණ) මගින්ද පුද්ගලයන්ට සහ ප්‍රජාවන්ට ඔවුන්ගේ ජීවිත පාලනය කිරීමට, තීරණ ගැනීමට සහ ඔවුන්ගේම සමාජ, ආර්ථික සහ දේශපාලන පරිසරයන් හැඩගස්වා ගැනීමට ක්‍රියාකාරීව සහභාගී වීමට හැකියාව ලබා දීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ප්‍රජාව සවිබලගැන්වීමේ ක්‍රියාවලියෙහි නියුතු ආයතන අතිරේක ලේකම් (ප්‍රජා සවිබලගන්වීම්) මගින්ද අධීක්ෂණය කරනු ලබයි.

## ගිණුම් අංශය

මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිදභාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මගින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වාගෙන යාම පැවරී ඇති අංශය ගිණුම් අංශය වේ.
අමාත්‍යාංශයට අදාළ ගිණුම් කටයුතු සහ සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අමතරව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩලවල ගිණුම් සුපරීක්ෂණය සිදුකරනු ලැබේ.

## අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශ ලේකම් වෙත සෘජුවම වගකීමට බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබන සේවාවන් හා වැඩසටහන් ගුණාත්මකව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය විගණනය, කාර්ය සාධන විගණනය, කළමනාකරණ විගණනය, පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවදානම් සහිත ක්ෂේත්‍ර පාදක කරගත් විගණනය සිදු කිරීම තුළින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ලඟාකරගැනීමට මඟපෙන්වීම් සිදු කිරීම කරනු ලබයි.

## සැලසුම් හා මෙහෙයුම් අංශය

අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු ,ව්‍යවස්ථාපිත ආයතනයන්හි හා සංවර්ධන අංශයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ක්‍රියාත්මක වැඩසටහන් මෙහෙයවීම , ප්‍රගති පාලනය සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණ කිරීම සැලසුම් හා මෙහෙයුම් අංශය යටතේ සිදුවේ. තවද විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්හි සම්බන්ධීකරණ හා අධීක්ෂණ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරයි.

## අභ්‍යන්තර කටයුතු ඒකකය පිහිටුවීම.

රාජ්‍ය නිලධාරීන්ගේ සුපිළිපන්නභාවය තහවුරු කරමින් අල්ලසෙන් හා දූෂණයෙන් තොර රාජ්‍ය සේවයක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය කිරීමේ අත්‍යවශ්‍ය වැදගත්කම කෙරෙහි රජයේ ප්‍රමුඛතම අවධානය යොමුව ඇත. රාජ්‍ය අංශය තුළ ශක්තිමත් දූෂණ විරෝධී ක්‍රියාමාර්ග හඳුන්වාදීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වැනි වගන්තිය යටතේ දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCAC) ඇතුළු අනෙකුත් දූෂණ විරෝධී ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවට ඇති බැඳීම්වලට අනුකූල වන අතරම, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත, නුදුරේදී එළිදැක්වීමට නියමිත අල්ලස් හා දූෂණ වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2025 – 2029) සහ රජයේ අනෙකුත් ප්‍රතිපත්ති අරමුණු සමඟ අනුගත වේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ දූෂණය මැඩලීමේ ක්‍රියාවලියේ ප්‍රධාන මුලපිරීමක් ලෙස රාජ්‍ය ආයතන පුරා විනිවිදභාවය, වගවීම සහ සුපිළිපන්නභාවය පෝෂණය කරන සංස්කෘතියක් නිර්මාණය කර, රජයේ සේවාවන් සියලුම පුරවැසියන්ට ඵලදායී ලෙස සැපයීම සඳහා ජනාධිපති ලේකම්ගේ අංක PS/SB/Circular/2/2025 සහ 2025.02.18 දිනැති චක්‍ර ලේඛය අනුව අප අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු ඒකකය පිහිටුවා ඇත.

## අභ්‍යන්තර කටයුතු ඒකකයේ ප්‍රධාන අරමුණු

I. ආයතනය තුළ දූෂණය වැළැක්වීම සහ සුපිළිපන්න සංස්කෘතියක් වර්ධනය කිරීම.

II. ආයතනයේ සියලුම ක්‍රියාකාරකම්වල විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සහ ආයතනික ක්‍රියාකාරකම් සහ තීරණ සම්බන්ධ තොරතුරු වෙත මහජන ප්‍රවේශය සහතික කිරීම.

III. ආයතනය තුළ සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කිරීම.

IV. විෂමාචාර වාර්තා කිරීම දිරිගැන්වීම, තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීම සහ රජසාභාවය පවත්වා ගැනීම සඳහා ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම.

V. නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අලලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් නීති බලාත්මක කිරීමට සහාය වීම.

## අභ්‍යන්තර කටයුතු ඒකකයෙහි වගකීම් සහ කාර්යයන්

ආයතනික සුපිළිපන්භාවයේ ප්‍රධාන අංග ඉලක්ක කර ගනිමින් ක්‍රියාශීලී, පැහැදිලි සහ කේන්ද්‍රගත දූෂණ විරෝධී ප්‍රයත්නයන් තහවුරු කිරීම සඳහා පහත සඳහන් නිශ්චිත වගකීම් සහ කාර්යයන් අභ්‍යන්තර කටයුතු ඒකකය වෙත පැවරී ඇත.

I. ආයතනය තුළ පවතින පද්ධතිමය බාධාවන් (systemic bottlenecks) හඳුනා ගැනීම සඳහා වත්මන් ක්‍රියා පටිපාටි සහ චක්‍රලේඛ පරීක්ෂා කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ඒවා සරල කිරීම.

II. දූෂණ අවදානම් ඇගයීම් (Corruption Risk Assessment) සිදු කිරීම මඟින් ආයතනය තුළ දූෂණයට හා සදාචාර විරෝධී හැසිරීම්වලට ගොදුරු විය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ඉලක්කගත වැළැක්වීමේ පියවර ගැනීම.

III. ආයතනයේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සකස් කරන ලද නිශ්චිත දූෂණ විරෝධී අරමුණු සහ උපායමාර්ග ඇතුළත් ආයතනික සුපිළිපන්න ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

IV. ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම සමඟ ආයතනික ප්‍රතිපත්ති සහ භාවිතයන් පෙළගස්වමින් ජාතික දූෂණ විරෝධී උපායමාර්ගවලට අනුකූල වීම.

V. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ඇතුළු ජාතික හා ජාත්‍යන්තර දූෂණ විරෝධී නීති සමඟ ආයතනයේ අනුකූලතාව ඇගයීම සඳහා අනුකූලතා සමාලෝචන (Compliance Assessment) සිදු කිරීම සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම.

VI. සියලුම රාජ්‍ය නිලධාරීන් සහ සේවා නියුක්තිකයන් සඳහා වත්කම් ප්‍රකාශන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා නියෝග

සහ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට අනුකූලව බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය කිරීම.

VII. ආයතනය තුළ දූෂණ සහ සදාචාර විරෝධී හැසිරීම් සම්බන්ධ පැමිණිලි භාර ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ආරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම, එවැනි සියලුම පැමිණිලි සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් හෝ ඒකක විසින් කඩිනමින් කටයුතු කරන බවට සහතික වීම සහ විනිවිදභාවය සහ වගවීම සහතික කරමින් විමසීම් සිදු කරන අදාළ පාර්ශවකරුවන් වෙත නිරන්තර යාවත්කාලීන කිරීම ලබා දීම. අවශ්‍ය පරිදි, දූෂණ විරෝධී පනත යටතේ විමර්ශනය සඳහා අදාළ කරුණු, සොයාගැනීම් හෝ තොරතුරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කිරීම.

VIII. ආයතනය විසින් සපයනු ලබන සේවාවන් විස්තර කෙරෙන පුරවැසි ප්‍රඥප්තියක් සංවර්ධනය කර ප්‍රකාශයට පත් කිරීම.

IX. රාජ්‍ය නිලධාරීන් විසින් පිළිපැදිය යුතු ප්‍රමිතිගත ආචාරධර්ම සංග්‍රහයක් ඇතුළුව, සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ බලාත්මක කිරීම.

X. දූෂණ විරෝධී මූලධර්මවලට කැපවී සිටීමට අභිප්‍රේරණයක් ලෙස කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ දැනුවත් කිරීම ඇතුළු අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම.

XI. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ජාතික දූෂණ විරෝධී රාමුව මඟින් මෙහෙයවනු ලබන සුපිළිපන්න ඇගයීම් ක්‍රියාවලීන් සඳහා ආයතනය සහභාගී වන බව සහ ඒ සමඟ පෙළගැසෙන බව සහතික කරමින්, ජාතික දූෂණ විරෝධී සුපිළිපන්න ඇගයීම (National Anti-Corruption Integrity Assessment) සඳහා ආයතනික කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම.

XII. ඒකකයේ රාජකාරි ක්‍රියාත්මක කිරීමේදී අඛණ්ඩ මඟපෙන්වීම් සහ සහාය ලබා ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම.

XIII. අභ්‍යන්තර කටයුතු ඒකකයෙහි ක්‍රියාකාරකම්, දූෂණ විරෝධී මුලපිරීම්වල ප්‍රගතිය, මුහුණ දෙන අභියෝග සහ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ සාරාංශගත කරමින් කාලානුරූපී සහ වාර්ෂික වාර්තා සකස් කිරීම.

XIV. පුද්ගලික අංශයේ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් සුපිළිපන්නතාවය වර්ධනය කිරීම සඳහා වන සැලසුම් සකස් කිරීම සඳහා වන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

## විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

| | ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුව රු.මිලියන | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|
| 1 | ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය (ADB) - ප්‍රදාන සංරචකය | ආසියානු සංවර්ධන බැංකුව | රු.මි 695.394 | 2022 අගෝස්තු සිට 2026 අගෝස්තු දක්වා |
| 2 | ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය (ADB) - ණය සංරචකය | ආසියානු සංවර්ධන බැංකුව | රු.මි. 1890 | 2022 සැප්තැම්බර් සිට 2026 අගෝස්තු |
| 3 | සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය | ලෝක බැංකුව | රු.මි. 2738 | 2023 - 2027 |

# පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1නෛතික විධිවිධාන ශක්තිමත් කිරීම

### ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූලව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා 2025.04.21 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ආබාධ සහිත තැනැත්තන්ගේ ජාතික සභාව විසින් නව ආදාර්ශ කෙටුම්පතක් සකස් කර ඇත.එය නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත සකස් කර ගැනීමට නියමිතව ඇත.

### සංඥා භාෂා පනත් කෙටුම්පත

සංඥා භාෂාව විධිමත් සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් පිළිගැනීමට හැකි වන පරිදි යෝජිත සංඥා භාෂා පනත හඳුන්වා දීම පිණිස ප්‍රතිපත්තිමය අනුමැතිය 2025.06.02 දින නව අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදෙන ලදී.ඒ අනුව මේ වන විට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත නිරීක්ෂණ ලබා ගැනීම උදෙසා යොමු කර ඇත.නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව සංඥා භාෂා පනත් කෙටුම්පතේ ඉදිරි කටයුතු කිරීමට නියමිතව ඇත.

### ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය

රජයේ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය 2006 අංක 1 දරන ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැලපෙන පරිදි නැවත සකස් කිරීම සිදු කරමින් පවතින අතර කමිටුවේ අවසන් නිරීක්ෂණ සිදු කරමින් ඇත.

### ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස්කිරීම

ආබාධ සහිත තැනැත්තන් සඳහා පවතින ජාතික ප්‍රතිපත්තිය යාවත්කාලීන කරමින් නැවත සකස් කිරීමේ කටයුතු සිදු කරමින් ඇත.

**වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම.**

2006 වර්ෂයේ දී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ප්‍රතිපත්ති සංග්‍රහයක් එළි දක්වා ඇති අතර, එම ප්‍රතිපත්තිය කාලාණුරූපී අවශ්‍යතාවයන්ට අනුව වෙනස් කරමින් නව ප්‍රතිපත්තියක් සකස් කළයුතු බව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් තීරණය කරන ලදි.විශේෂයෙන් සීඝ්‍රයෙන් වර්ධනය වන වැඩිහිටි ජනගහනය හමුවේ මතුවන සංකීර්ණ අභියෝගයන්ට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා පූර්ණ ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය බව තීරණය කරන ලදී. මෙම අවශ්‍යතාවයට මුහුණදීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා ප්‍රතිපත්ති සම්පාදක කමිටුවක් පත් කරන ලදී.

එම ප්‍රතිපත්ති සම්පාදක කමිටුව විසින් සකස් කරන ලද වැඩිහිටි ජාතික ප්‍රතිපත්තිය, වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු 2025 ඔක්තෝබර් 01 වන දින පවත්වන ලද ජාතික වැඩිහිටි දින උත්සවයේදි **ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්නත් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය** ලෙස තෙයිභාෂාවෙන් මුද්‍රණය කොට එළි දක්වන ලදි.

**වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත.**

ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය හා අභිමානය සහතික කරමින් වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරලීම වෙනුවෙන් 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනිමේ පනත සහ 2011 අංක 05 දරන සංශෝධිත පනතින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.ඉහත සඳහන් කර ඇති පනත් කාලානුරූපී අවශ්‍යතාවයන්ට අනුව නැවත සංශෝධනය කළ යුතු බව 2019.05.14 වන දින පවත්වන ලද වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 20 වන සභාවාරයේ දී තීරණය කරන ලදී.

එසේම 2019 වර්ෂයේ දී නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කළයුතු බවට උපදෙස් ලබා දී ඇති අතර, 2023.05.10 වන දින පැවති ක්‍රම සහ විධි පිළිබඳ පැවති කාරක සභාව විසින් ද මෙම පනත් සංශෝධනය කළ යුතු බවට උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව එවකට පැවති ජාතික සභාව විසින් මෙම පනත් නැවත සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත්කරන ලද අතර, කැබිනට් පත්‍රිකාව මඟින් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදි.එම කැබිනට් අනුමැතිය ලැබීම පිළිබඳව දැනුවත් කිරීමට හා මූලික කෙටුම්පත සැකසීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත මේ වන විට යොමු කොට ඇත.

### වැඩිහිටි නිවාස සඳහා රෙගුලාසි සහ මාර්ගෝපදේශ සකස් කිරීම

ලෝකයේ වැඩිහිටි ජනගහනය වැඩිවීමේ සංසිද්ධියට සමගාමීව ලංකාවේ වැඩිහිටි ජනගහන ව්‍යාප්තිය ද සාපේක්ෂව ඉහළ යන අතර, එමගින් අසරණ වන වැඩිහිටි ප්‍රජාවගේ රැකවරණය සලසා දීම හා ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා සේවා සපයනු ලබන සියලුම ආයතන නියාමනයට අදාළ මාර්ගෝපදේශ හා නියෝග සකස් කිරීම සඳහා 2025.05.30 වන දින පවත්වන ලද වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් පස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළ අතර ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන සියලුම වැඩිහිටි නිවාස නියාමනය සඳහා නියෝග සකස් කිරීමේ මූලික කෙටුම්පත 2025.12.31 වන විට සකස් කර අවසන් කර ඇති අතර, එය වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත යොමු කොට එහි අදහස් හා යෝජනා ලබා ගන්නා ලදි.

## 2.2 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

### ❄ ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSPD)

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන -2025 සහ ප්‍රගතිය- 2025.12.31 දින දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 650.47 | 58.71 |
| පුනරාවර්තන | 34.53 | 17.02 |
| එකතුව | 685.00 | 75.73 |

**ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2025.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

**භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්**

❖ ප්‍රාග්ධන ප්‍රතිපාදන

මූල්‍ය ආධාර ලබා දීම

- ආබාධ සහිත පුද්ගලයන් 365 ක් සඳහා වෛද්‍යාධාර සැපයීම (ශල්‍යකර්ම, ඖෂධ සහ සායන සඳහා ගමන් වියදම් සඳහා) - මූල්‍ය ප්‍රගතිය රු. මි 9.50
- ආබාධ සහිත සිසුන් 539 ක් සඳහා අධ්‍යාපනික ආධාර ලබාදීම - මූල්‍ය ප්‍රගතිය රු. මි 11.10
- ආබාධ සහිත පුද්ගලයන් 184 ක් සඳහා ස්වයං රැකියා සඳහා ආධාර ලබා දීම - මූල්‍ය ප්‍රගතිය රු. මි 7.90

ආධාරක උපකරණ සැපයීම (කණ්නාඩි, රෝද පුටු, අත්වාරු ආදිය)

- ආබාධ සහිත පුද්ගලයන් 10,418 ක් සඳහා ආධාරක උපකරණ සැපයීම හා ආධාරක උපකරණ මිලදී ගැනීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 15.58

**ආබාධ සහිත පුද්ගලයින්ට සේවා සපයන ස්වේච්ඡා සංවිධානවලට මූල්‍ය ආධාර ලබා දීම**

- අබාධ සහිත පුද්ගලයින්ට සේවා සපයන ස්වේච්ඡා සංවිධාන 5ක් සඳහා මූල්‍ය ආධාර ලබා දීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 1.00

**ආබාධ සහිත පුද්ගලයින්ගේ කුසලතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම**

- ආබාධ සහිත පුද්ගලයින්ගේ කුසලතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට ආයතන 14 ක් සඳහා ආධාර ලබා දීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 1.18

**සංඥා භාෂා සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම**

- රජයේ නිලධාරීන් 68ක් සඳහා සංඥා භාෂා සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 0.37

**ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම**

- අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා අත්‍යවශ්‍ය උපකරණ ලබා ගැනීම - මූල්‍ය ප්‍රගතිය 0.11

**ආබාධ සහිත තැනැත්තන් සඳහා දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම**

2025 අයවැය යෝජනාවක් මගින් රු.මි. 100 ක් දත්ත පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා ප්‍රතිපාදන ලෙස ලබා දී ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සංගණනය සඳහා භාවිතා කරන ක්‍රියාකාරකම් සැලැස්ම භාවිතා කරමින් NSPD සංගණන ක්‍රියාකාරකම් ලේඛන සැලැස්ම සකස් කරනු ලැබීය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහාය ඇතිව ලැයිස්තුගත කිරීමේ ප්‍රශ්නාවලිය සකස් කර ගන්නා ලදී. ක්ෂේත්‍ර කටයුතු සඳහා, කාර්යාල කටයුතු සහ අධීක්ෂණ කටයුතු, තාක්ෂණික දැනුම සම්බන්ධයෙන් අවශ්‍ය මානව සම්පත් හඳුනා ගැනීම සිදු කර ගනු ලැබීය. ලැයිස්තුගත කිරීමේ සහ දත්ත රැස් කිරීම සඳහා තෝරාගත් ක්‍රමවේදය සඳහා කමිටු අනුමැතිය හා ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සිදු කරන ලදී. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඩිජිටල් අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය එක්ව සාකච්ඡාවක් පැවැත්වූ අතර එහි දී ප්‍රශ්නාවලිය සඳහා අනුමැතිය ලැබීය. මෘදුකාංගය සකස් කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. වර්ගීකරණය පිළිබඳ මහජන අදහස් විමසීමට වෙබ් අඩවියෙහි පළ කළ අතර සංඥා භාෂාවෙන් ද මේ වන විට ඇතුළත් කර ඇත. දත්ත පද්ධතිය සැකසීම සඳහා අවශ්‍ය Laptop හතරක් සහ මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමට කටයුතු කරන ලදී. දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම (මාර්ගගත ක්‍රමයට) 2025.11.18 දින සිදු කරනු ලැබීය. ආබාධ සහිත පුද්ගලයින්ගේ තොරතුරු ලබා ගැනීමට අදාළව ඔවුන් දැනුවත් කිරීම සඳහා ග්‍රාම

නිලධාරී කාර්යාලවල ප්‍රදර්ශනය කිරීමට දැන්වීම් පත්‍රිකාවක් සකස් කර ලබාදී ඇත. – (මූල්‍ය ප්‍රගතිය රු.මි. 9.89)

- **පුනරාවර්තන ප්‍රතිපාදන**

වික්ටෝරියා නිවාසය සඳහා මාසික නඩත්තු වියදම් ලබා දීම

- ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වික්ටෝරියා නිවාසයේ මාසික නඩත්තු වියදම් ලබාදීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 15.00 (අබාධ සහිත පුද්ගලයින් 120 ක් නේවාසිකව සිටිති)

ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකියා අවස්ථා ලබාදීම

- ආබාධ සහිත පුද්ගලයින් 39 ක් සඳහා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබාදීම සහ ඔවුන්ගේ වැටුපෙන් 50% (උපරිම රු. 15,000) ක් දක්වා රජය විසින් ගෙවීම සිදුකරයි) - මූල්‍ය ප්‍රගතිය රු.මි 0.83

**වෙනත් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන්**

**ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම**

සුපිරි වාසනා සම්පත ලොතරැයි අරමුදල් ආදායමෙන් 5%ක ප්‍රතිපාදන මේ සඳහා වාර්ෂිකව වෙන් කෙරේ. ඒ අනුව පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- ආබාධ සහිත තැනැත්තන් 403 ක් සඳහා නිවාස ආධාර ලබාදීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 56.23
- ආබාධ සහිත තැනැත්තන් 103 ක් ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම- මූල්‍ය ප්‍රගතිය රු.මි 10.96

අබාධ සහිත තැනැත්තන් සඳහා වන ලේකම් කාර්යාල අරමුදල

- ආබාධ සහිත පුද්ගලයන් 86 ක් සඳහා වෛද්‍ය ආධාර සැපයීම (ශල්‍යකර්ම, ඖෂධ සහ සායන සඳහා ගමන් වියදම් සඳහා) - මූල්‍ය ප්‍රගතිය රු.මි. 1.99
- ආබාධ සහිත සිසුන් 81 ක් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 1.99
- ආබාධ සහිත පුද්ගලයන් 21ක් සඳහා ස්වයං රැකියා ආධාර සැපයීම - මූල්‍ය ප්‍රගතිය රු.මි.0.98

අබාධ සහිත තැනැත්තන් සඳහා වෛද්‍යාධාර සැපයීම

අබාධ සහිත තැනැත්තන් සඳහා ජනාධිපති අරමුදලෙන් මෙම වසරේ සිට මුදල් වෙන් කර ඇත.

- ආබාධ සහිත පුද්ගලයන් 197 ක් සඳහා වෛද්‍ය ආධාර සැපයීම (ශල්‍යකර්ම, ඖෂධ සහ සායන සඳහා ගමන් වියදම් සඳහා) - මූල්‍ය ප්‍රගතිය රු.මි. 10.1

## ❄ වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSE)

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන- 2025 සහ ප්‍රගතිය - 2025.12.31 දින දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 20.00 | 20.00 |
| පුනරාවර්තන | 200.00 | 196.64 |
| එකතුව | 220.00 | 216.64 |

**ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2025.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

**පුනරාවර්තන ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්**

වැඩිහිටි තැනැත්තන් සඳහා සෞඛ්‍ය ආධාර ලබා දීම

- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 4472ක් සඳහා ශ්‍රවණාධාර, අක්ෂිකාච සහ ඇස්කණ්නාඩි ලබාදීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 48.85
- වැඩිහිටියන් සඳහා වෛද්‍ය කඳවුරු 16 ක් පැවැත්වීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 10.23

වැඩිහිටියන් රැකබලාගැනීම

- මාලිගාතැන්න, පන්නල සහ කතරගම වැඩිහිටි නිවාසවල පරිපාලන කටයුතු සඳහා වියදම් කිරීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 15.095
- වැඩිහිටියන්ට තමන්ගේම නිවෙස්වල ජීවත් වීමට අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා ක්‍රියාත්මක“සුවපහසු” මූල්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ වැඩිහිටියන් 2008 ක් සඳහා මූල්‍යාධාර සැපයීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 79.996
- වැඩිහිටි නිවාස 13ක් අලුත්වැඩියා කිරීම සහ උපකරණ සැපයීම සඳහා - මූල්‍ය ප්‍රගතිය රු.මි 24.837

වැඩිහිටි අයිතිවාසිකම් ප්‍රවර්ධනය

- වැඩිහිටි හැඳුනුම්පත් 50,000ක් මුද්‍රණය කිරීම, වැඩිහිටි හැඳුනුම්පත් 44,899 නිකුත් කිරීම හා ලැමිනේටින් ආවරණ කවර 1100ක් හා ලැමිනේටින් උපකරණ 65ක් මිලදී ගැනීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 2.030

- වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව පැවැත්වීමට අදාළව සභා රැස්වීම් 9 ක් පැවැත්වීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 1.259
- වැඩිහිටි නඩත්තු මණ්ඩලය පවත්වාගෙන යාමට අදාළව නඩු වාර 93ක් පැවැත්වීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 1.509

**සමාජීය හා අධ්‍යාත්මික වැඩසටහන්**

- වැඩිහිටියන් සඳහා වැඩසටහන් 3ක් පැවැත්වීම හා රැස්වීම් 2ක් පැවැත්වීම (වැඩිහිටි දින වැඩසටහන් සහ අලුත් අවුරුදු උත්සව වැඩසටහන්) - මූල්‍ය ප්‍රගතිය රු.මි 2.100

**පරිපාලන වියදම්**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 340ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක් සඳහා පරිපාලන වියදම් දැරීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 6.960

**ප්‍රාග්ධන ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 74ක් සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ ලබා ගැනීම, පරිගණක 52ක් ලබා ගැනීම හා ධාරිතා සංවර්ධන වැඩසටහන් 4ක් පැවැත්වීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 19.851

**වැඩිහිටි සුභසාධන ජාතික අරමුදල මඟින් ක්‍රියාත්මක වැඩසටහන්**

- වැඩිහිටියන් රැකබලාගැනීමට අදාළව වැඩසටහන් 9ක් පැවැත්වීම. - මූල්‍ය ප්‍රගතිය රු.මි. 1.69
- වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 20 ක් ඉදි කිරීම සඳහා ආධාර ලබා දීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 30.73
- දිරිය පියස නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස 24 ක් ඉදිකිරීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 16.81
- වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 13 ක් සඳහා උපකරණ ලබාදීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 8.61
- වයස්ගත වීම සම්බන්ධව තරුණ ප්‍රජාව දැනුවත්කිරීමේ වැඩසටහන් 16 ක් පැවැත්වීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 1.62
- “ආරෝග්‍ය” වෛද්‍ය ආධාර වැඩසටහන යටතේ වැඩිහිටියන් 875 ක් සඳහා වෛද්‍යාධාර ලබාදීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 21.85
- වැඩිහිටියන් සඳහා ආගමික චාරිකා 238 ක් සංවිධානය කිරීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 19.76
- වැඩිහිටියන් 205 දෙනෙක් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 10.09
- වැඩිහිටිභාවය පිළිබඳව පාසල් ළමුන් දැනුවත්කිරීමේ වැඩසටහන් 19 ක් පැවැත්වීම මූල්‍ය ප්‍රගතිය රු.මි 0.71
- විශ්‍රාම පූර්ව වැඩසටහන් 23 ක් පැවැත්වීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 2.29

- වැඩිහිටියන්ගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා (යෝගා පුහුණුව) සහ ඩිජිටල් සාක්ෂරතාවය සම්බන්ධ වැඩසටහන් 7 ක් පැවැත්වීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 5.52
- ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි කමිටු 469 ක් බලගැන්වීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 47.27
- දෙහිඅත්තකණ්ඩිය සරණ වැඩිහිටි නිවාසයේ පරිපාලන වියදම් කටයුතු - මූල්‍ය ප්‍රගතිය රු.මි 0.24
- ලියාපදිංචි වැඩිහිටි සමිති සඳහා මුද්‍රණ සහතික 2000 ක් නිකුත් කිරීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 0.35
- කතරගම වැඩිහිටි නිවාසයේ සැපයුම් ඉදිකිරීම 100% ක් හා මිලදී ගැනීම් 100% සම්පූර්ණ කිරීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 110.30
- වැඩිහිටි නිවාස 4ක ඉදිකිරීම් කටයුතු සිදු කිරීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 2.78
- 2025 ඔක්තොම්බර් 01 වන දින ජාතික වැඩිහිටි දිනය ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් සැමරීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 4.84

## ❄ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන-2025 සහ ප්‍රගතිය - 2025.12.31 දින දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 30.00 | 17.00 |
| පුනරාවර්තන | 218.00 | 194.41 |
| එකතුව | 248.00 | 211.41 |

**ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2025.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීම

නව සාමාජික බඳවාගැනීම් සංඛ්‍යාව 66,977 කි.

රැස්කළ පළමු වාරික මුදල රු. මි. 318.68 කි.

රැස් කළ පසු වාරික මුදල රු.මි. 335.96 කි.

පසු වාරික ගෙවූ සාමාජික සංඛ්‍යාව 171,128 කි.

සාමාජිකයන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය සහ සාමාජිකයින් සඳහා අනෙකුත් ප්‍රතිලාභ ප්‍රදානය

විශ්‍රාමිකයින් 37,386 ක් සඳහා රු.මි. 452.37 ක විශ්‍රාම වැටුප් ගෙවීම

අනෙකුත් ප්‍රතිලාභ ලැබූ සාමාජිකයන් 1750ක් සඳහා රු.මි 38.71ක් ගෙවීම් කිරීම

දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

ස්වයං රැකියාවල නියුතු පුද්ගලයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 2539 ක් පැවැත්වීම

වෘත්තීය පුහුණු ආයතන සහ තරුණ කණ්ඩායම් සඳහා ස්වයං රැකියා/ ව්‍යවසායකත්ව ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම.

ඔරුගොඩවත්ත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ශිෂ්‍යයින් 147ක් සඳහා වැඩසටහනක් පැවැත්වීම

සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා ජන මාධ්‍ය හරහා ප්‍රචාරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- Whatsapp හා Face Book ප්‍රවර්ධනය කිරීමේ කටයුතු සිදු කිරීම
- යූ ටියුබ් නාලිකා දැන්වීම් ප්‍රචාරය කිරීම
- ගුවන්විදුලි වැඩසටහන් 02ක් මෙහෙයවීම
- රූපවාහිනී වැඩසටහන් 03ක් පැවැත්වීම

## ප්‍රාග්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

### කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

- කණ්ඩායම් පුහුණු වැඩසටහන් 7ක් නිලධාරින් 405කගේ සහභාගිත්වයෙන් සහ මාණ්ඩලික නිලධාරින් 11කගේ සහභාගිත්වයෙන් තනි පුද්ගල පුහුණු වැඩසටහන් පැවැත්වීම හා කාර්ය මණ්ඩලයේ නිලධාරින් 13ක් සඳහා දෙමළ පුහුණු පාඨමාලාව පැවැත්වීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 0.85

### තොරතුරු තාක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම

- පරිගණක උපාංග මිලදී ගැනීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 2.90

### පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීම සඳහා කාර්යාල පහසුකම් වැඩිදියුණු කිරීම

- ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට කාර්යාල උපකරණ මිලදී ගැනීම - (මූල්‍ය ප්‍රගතිය රු.මි. 9.70)

### වාහන සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම

- අලුත්වැඩියා කරන ලද වාහන සඳහා ගෙවීම - (මූල්‍ය ප්‍රගතිය රු.මි. 2.11)

### නව විශ්‍රාම වැටුප් තොරතුරු කළමනාකරණ පද්ධතිය සකස් කිරීම

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රතිලාභ/ දායකත්ව ක්‍රියාදාමයන් ඩිජිටල්කරණය සඳහා ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ තාක්ෂණික දායකත්වය එක් කරමින් ආරක්ෂිත, විශ්වාසනීය, පරිශීලක හිතකාමී ඩිජිටල් සේවාවක් ලෙස ඒකාබද්ධ පරිගණක පද්ධතියක් **SSBTrustPOST** නමින් සකස් කොට අවසන් කොට ඇත.

මෙහි අරමුණ වන්නේ ලියාපදිංචි කිරීම → OTP සත්‍යාපනය → ගෙවීම් (අයදුම්/ මාසික) → වොලට්/ගිණුම් කළමනාකරණය → ආපසු ගැනීම් **(Withdrawal)** පාලනය → **SMS** දැනුම්දීම් → වාර්තා/ පාලනය යන සම්පූර්ණ ක්‍රියාදාමය ම පාරදෘශ්‍ය , සුරක්ෂිත සහ වගකීම් සහගත තත්ත්වයට පත් කිරීමයි.

**ප්‍රධාන අරමුණු**

1. ජාතික මට්ටමේ ප්‍රතිලාභි සේවාවන් ඩිජිටල් කිරීම - ලියාපදිංචිය, විශ්‍රාම ගෙවීම්, වාර්තා තබා ගැනීම
2. OTP/ **SMS** මඟින් පුරවැසි සත්‍යාපනය සහ දැනුම්දීම
3. බැංකු ගෙවීම් ඒකාබද්ධ කිරීම (**Peoples Bank IPG – Card/QR**)
4. දත්ත ආරක්ෂාව, ඇතුළත්වීම් පාලනය, **audit trail** සහ දූෂණ අවදානම් අඩු කිරීම
5. **Debit/Credit** කාඩ්පත් සහ බැංකු ගිණුම් වලින් **Online** ගෙවීම්, මූලික ලියාපදිංචිය සහ තැපැල් කාර්යාල ජාලය, බැංකු පද්ධතිය සහ වෙනත් එකතු කිරීම් නියෝජිත ආයතන හරහා වාරික ගෙවීම් ස්වයංක්‍රියකරණය

මේ සඳහා රු.මි. 5.00 වෙන් කරන ලද නමුත් තැපැල් දෙපාර්තමේන්තුව මෙම පරිගණක පද්ධතිය නොමිලේ සකස් කර දීමට එකඟ වූ අතර එහි මූලික සංවර්ධන කටයුතු 2025 වසර තුළ අවසන් කරන ලදී.

## ❄ ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන- 2025 සහ ප්‍රගතිය - 2025.12.31 දින දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන (සීදූව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම ) | 180.00 | 29.57 |
| ප්‍රාග්ධන (සුහුරු ගම්මාන ව්‍යාපෘතිය) | 7.00 | 4.29 |
| ප්‍රාග්ධන (වෙනත්) | 50.00 | 24.21 |
| පුනරාවර්තන | 249.00 | 184.34 |
| එකතුව | 486.00 | 242.41 |

**ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන්**

**ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදූව ප්‍රදේශයේ ඉදිකරනු ලබන ගොඩනැගිලි සංකීර්ණය**

- A හා B වශයෙන් කොටස් දෙකකින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම 2017.01.01 දින ආරම්භ කරන ලද අතර 2022 ඔක්තෝබර් මස අවසන් කිරීමට සැලසුම් කරන ලද නමුත් සැලසුම් කාල සීමාව 2025 ඔක්තෝම්බර් 30 දින දක්වා දීර්ඝ කර ඇත. මෙම ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත මුළු වියදම රු. මිලියන 1187.54 ක් වේ.2025 වර්ෂය තුල අත්කරගත් භෞතික ප්‍රගතිය 0.31%කි. සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 1001.31, සමුච්චිත භෞතික ප්‍රගතිය 98.50%) ක වැඩ අවසන්කොට ඇත.

**සුහුරු ගම්මාන ව්‍යාපෘතිය**

- පළාත් 9 කට අයත් තෝරාගත් ගම්මාන 9 කට සමාජ වැඩ උපාධිය අවසන් වසර ශිෂ්‍යයන් 18 දෙනෙකු ජනවාරි මස ක්ෂේත්‍රගත කළ අතර ග්‍රාමීය ක්‍රියාකාරකම් සඳහා ප්‍රජා වැඩවලට පහසුකම් සැලසීම පිළිබඳව එම ශිෂ්‍යයන් 18 දෙනා ට මූලික අධ්‍යාපනය ලබාදෙන ලදී. එම සිසුන් 18 දෙනා මාර්තු මාසයේදි ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා සහභාගී වෙන ලදි.ශිෂ්‍යයන් විසින් ගම්මාන වල ස්ථාපිත ප්‍රජා පාදක ආයතනවලට ගම්මාන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමේ කාර්යය කරන ලදී. ප්‍රජාවේ සාමාජිකයින්ගේ සහභාගීත්වය සමඟ පොදු අවශ්‍යතාව හඳුනාගැනීම මෙන්ම ග්‍රාමීය කාන්තා සංවර්ධන සංවිධාන සක්‍රීය කිරීම, “ක්ලීන් ශ්‍රී ලංකාව” ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සහ අනෙකුත් මූලික දැනුවත් කිරීම් වැඩසටහන්

ක්‍රියාත්මක කරන ලදි. සුහුරු කෘෂිකර්මය -(Smart Agriculture) සඳහා ගොවියන්ට නවීන ක්‍රම, වට්නාකම් එක්කළ නිෂ්පාදනය සහ ජලාපවහන කාර්යක්ෂමතාව පිළිබඳ පුහුණුව , සුහුරු ආර්ථිකය - (Smart economy) සඳහා අලෙවිය සඳහා ඩිජිටල් අලෙවි සහතයෝගිතාවක් හෝ ඔන්ලයින්/ ෆේස්බුක් වෙළෙඳපොළක් සංවර්ධනය කිරීම , සුහුරු තරුණ සංවර්ධනය -(Smart Youth Development) සඳහා පෞද්ගලික හා රාජ්‍ය නොවන රැකියා අවස්ථා ව්‍යාප්තිය , සුහුරු අධ්‍යාපනය - (Smart Education) ස්මාර්ට් පුස්තකාල ,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අධ්‍යාපනය හඳුන්වාදීම සහ පාසල්වල ඉලෙක්ට්‍රෝනික සම්පත් ප්‍රවේශය වර්ධනය කිරීම , සුහුරු සමාජ ආරක්ෂාව - (Smart Social Protection) සමාජ සුභසාධන , ක්ෂුද්‍ර ණය පහසුකම් සහ කාන්තා නායකත්වතයන් වූ පවුල් සඳහා සහාය ලබාදී කාන්තා සංවර්ධන සංගම් සක්‍රීය කිරීම සිදු කරන ලදි. (රු.මි.4.29)

## ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම

- උපකරණ මිලදී ගැනීම යටතේ ඡායා පිටපත් යන්ත්‍ර 03,ලැප්ටොප් පරිගණක 10, ඩිජිටල් තිර 2, කැමරා 01,ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ හා පුස්තකාල පොත් මිලදී ගැනීම (රු.මි. **20.131**)
- අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් අලුත්වැඩියා කිරීම, වාහන හා ඡායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම ((රු.මි. **3.833)**

## පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

- සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව සිසුන් 850 ක් හැදෑරීම, ජාත්‍යන්තර සමාජ වැඩ දිනය සැමරීම, බාහිර සම්පත් දායකයින් 30 දෙනෙකු සඳහා ගෙවීම් සිදුකිරීම, අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 4ක් පැවැත්වීම, සිසුන් 334 ක් සඳහා ආයතනික ශිෂ්‍යාධාර ලබා දීම හා සිසුන් 225ක් වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වීම.
- පුස්තකාල කමිටු රැස්වීම් 4ක් සහ පුස්තකාල උපදේශක කමිටු රැස්වීම් 2ක් පැවැත්වීම මගින් පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම ලබා ගැනීම.
- පර්යේෂණ අංශය මඟින් පර්යේෂණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් 4 ක් පැවැත්වීම, ජර්නල් 5 ක් සහ පුවත් හසුන් 2 ක් ප්‍රකාශයට පත්කිරීම, පර්යේෂණ සම්මන්ත්‍රණ 2 ක් පැවැත්වීම හා රිදියගම නිවර්තන නිවාසයේ පදිංචි වී සිටින වීදි යාචකයින්" පිළිබඳ පර්යේෂණය සම්පූර්ණ කිරීම.

- පුහුණු අංශය මඟින් ප්‍රජා මට්ටමේ නිලධාරීන් 880 ක් සඳහා පුහුණු වැඩසටහන් 28 පැවැත්වීම, ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සහ පීඨ අධීක්ෂකවරු පුහුණු කිරීමේ වැඩමුළු 5 ක් පැවැත්වීම
- වෘද්ධ විද්‍යාව පිළිබඳ නව උපාධි පාඨමාලාවක් හා මනෝවිද්‍යාව සහ උපදේශන පිළිබඳ නව උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීම සම්බන්ධ සංශෝධිත යෝජනාව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආකෘතියට අනුව සකස් කර ඇත. මනෝවිද්‍යාව සහ උපදේශනය පිළිබඳ නව උපාධි වැඩසටහන් සම්බන්ධ අනුකූලතා වාර්තාව සම්පූර්ණ කර රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයට ඉදිරිපත් කරන ලදී.
- පර්යේෂණ අංශය හා සමාජ සේවා විද්‍යාලය මගින් සමාජ ප්‍රතිපත්ති සහ සමාජ සංවර්ධනය පිළිබඳ නව උපාධි වැඩසටහන සඳහා සමාලෝචන කණ්ඩායම් වාර්තාව ලැබුණ අතර සමාජ වැඩ උපාධි පාඨමාලාවෙහි විෂය මාලාව,විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආකෘතියට අනුව සංශෝධනය කර ඇත.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය මගින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහනක් 6 ක් පැවැත්වීම, ඊ ජ'ර්නල් 01 ක් ප්‍රකාශයට පත් කිරීම හා බුද්ධිමය සංවාදයක් පැවැත්වීම සිදුකර ඇත.
- ශිෂ්‍යයන්ගේ සුබසාධනය සඳහා අදාල වැඩසටහන් 2 ක් හා සුබසාධන වැඩමුළු 3ක් පැවැත්වීම, වෛද්‍ය හා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම.
- විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය මගින් විෂයමාලා පිළිබඳ සමාලෝචන වැඩමුළු 3 ක් පැවැත්වීම.
- ලේඛකාධිකාරී අංශය මගින් විභාග 17 ක් පැවැත්වීම හා වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වීම සිදුකර ඇත.
- තත්ත්ව සහතික මධ්‍යස්ථානය මගින් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් 3 ක් සහ වැඩමුළු 2 ක් පැවැත්වීම සිදුකර ඇත. එමෙන්ම උපාධි පාඨමාලාවන් පිළිබඳ තීරණ ගැනීමේ **BGS** උපාධි අධ්‍යයන මණ්ඩල රැස්වීම් 01 ක් හා ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ජාතික සමාජ සංවර්ධන ආයතන පාඨමාලා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම.

  **මේ සඳහා වියදම් කරන ලද මුළු මුදල රු.මි.** 31.49

## ආයතනය මඟින් මුදල් අයකර පවත්වන ලද පාඨමාලා

### සමාජ සේවා විද්‍යාලය

ආයතනයේ සමාජ සේවා විද්‍යාලය මගින් පවත්වන සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ (2021/2022, 2022/2023, 2023/2024) අධ්‍යයන වර්ෂයන්ට අදාළව සිසුන් 252 ක් පාඨමාලාවන් හදාරා ඇති අතර සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව (2023/2024) සිසුන් 17 ක් හදාරා ඇත. (වියදම - රු.මි. 7.737, ආදායම - රු.මි. 10.929). 2025 වර්ෂයේ පවත්වන ලද උපාධි ප්‍රධානෝත්සවයේදී සිසුන් 57 දෙනෙකු සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගන්නා ලදී.

### පුහුණු අංශය

ආයතනයේ පුහුණු අංශය මගින් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන කේන්ද්‍ර කොට ගනිමින් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2023/2024, 2024/2025), ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2025) යන අධ්‍යයන වර්ෂයන්ට අදාළව සිසුන් 657 ක් අධ්‍යයන කටයුතු වල නිරත විය.

2025 වර්ෂයේ පවත්වන ලද ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රධානෝත්සවයේදී සිසුන් 173ක් සහතික පත්‍ර ලබා ගන්නා ලදී.

### පර්යේෂණ අංශය

ආයතනයේ පර්යේෂණ අංශය මගින් ක්‍රියාත්මක වැඩසටහන් අතර ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය සමඟ සහයෝගයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන සහතික පත්‍ර පාඨමාලාව ( සිසුන් 70) සහ පර්යේෂණ ක්‍රමවේදය සහ අධ්‍යයන ලේඛනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) (සිසුන් 150 ) පැවැත්වීම ප්‍රධාන වේ . - ( වියදම - රු.මි. 0.4, ආදායම - රු.මි. 0.4 )

## ආයතනයේ අරමුදල් මඟින් පවත්වනු ලබන වැඩසටහන්

- පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ ආයතනික ශිෂ්‍යයන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම හා කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
- පුස්තකාල පොත් 14962ක් ඉන්වෙන්ට්‍රි ගත කර ඇත.
- තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය විසින් අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන්, පීඨ මණ්ඩල සංවර්ධන වැඩමුළු, පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ ලිපි ලේඛන ඩිජිටල්කරණය සඳහා අදාළ ශාස්ත්‍ර ගෙවීම හා මේ පිළිබඳ පුහුණු වැඩමුළුවක් සිදු කර ඇත.
- ආසියා පැසිෆික් සමාජ වැඩ සම්මන්ත්‍රණය පැවැත්වීම මඟින් සමාජ වැඩ වෘත්තීය සංවර්ධනය සඳහා කටයුතු කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ මධ්‍යස්ථානය දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් හා ජාතික සම්මන්ත්‍රණය පැවැත්වීම සිදු කරන ලදී.

**මේ සඳහා වියදම් කරන ලද මුළු මුදල රු.මි. 3.07**

## ❄ ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය (RDB)

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන 2025 සහ ප්‍රගතිය - 2025.12.31 දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | **1100** | **878.94** |

**ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2025.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

### ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

- සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාශයක් සඳහාම ග්‍රාම සංවර්ධන සැලසුම් (VDP) 14022 ක් සකස් කිරීම - මූල්‍ය ප්‍රගතිය රු.මි. 129.41
- තෝරාගත් ව්‍යාපෘති 218 ක් ක්‍රියාත්මක කිරීම - මූල්‍ය ප්‍රගතිය රු.මි 643.59

**උපකාරක ක්‍රියාකාරකම් (ශක්‍යතා අධ්‍යයන, දැනුවත් කිරීම්, පුහුණු හා ක්ෂේත්‍ර චාරිකා)**

- ව්‍යාපෘති ශක්‍යතාව සඳහා වලංගුකරණ වාර්තා 23ක් සකස් කිරීම
- පාර්ශවකරුවන්ගේ රැස්වීම් 9 ක් පැවැත්වීම
- දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2 ක් පැවැත්වීම
- ජාතික මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ දෙදින වැඩසටහනක් පැවැත්වීම (TOT)
- දිස්ත්‍රික් මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 25 ක් පැවැත්වීම (TOT)
- කොට්ඨාශ මට්ටමේ පුහුණු වැඩසටහන් 630 ක් පැවැත්වීම
- ක්ෂේත්‍ර මට්ටමේ ව්‍යාපෘති නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර චාරිකා 15ක් සිදු කිරීම

**මේ සඳහා දරන ලද මුළු වියදම රු.මි. 51.7**

### "ප්‍රජා ශක්ති" ජාතික ව්‍යාපාරය

පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' රජයේ ප්‍රතිපත්තියට අනුව පොහොසත් වීම යනු ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වීම පමණක් නොවන අතර අධ්‍යාපනය, සෞඛ්‍ය, යහපත් ජීවන තත්ත්වය සහ ආකල්පමය වශයෙන් ද ශක්තිමත් වීම තුළින් පුද්ගල පෞරුෂයේ වර්ධනය, රටේ ආර්ථික සංවර්ධනය

හා බද්ධ වෙමින් ජීවන මට්ටම උසස් තත්ත්වයට පත්වීම ලෙස අර්ථ දක්වා තිබේ. ඒ අනුව, දිළිඳු බව තුරන් කිරීමට නම් රටේ ජනතාව සෑම අතින්ම පොහොසත් මිනිසුන් බවට පරිවර්තනය කළ යුතුය.

ඒ අනුව, සවිබල ගැන්විම හා සමාජ ආරක්ෂණය සඳහා මෙතෙක් පැවති සමස්ත ක්‍රියාවලියේ අත්දකින ලද ගැටලු හා දුර්වලතා නිරාකරණය කර ගනිමින් ඒ සඳහා සක්‍රීය ප්‍රජා සහභාගිත්වයක් සහිත මහජන කේන්ද්‍රීය සංවර්ධන ව්‍යුහයක් ස්ථාපනය කිරීම මූලිකව අරමුණු කොටගෙන 'ප්‍රජා ශක්ති' දිළිඳුකම පිටුදැකීමේ ජාතික ව්‍යාපාරය ක්‍රියාත්මක කරනු ලැබේ.

- ප්‍රජා සංවර්ධන කමිටු 9244 ක් ස්ථාපිත කිරීම
- පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් 8ක් පැවැත්වීම
- ප්‍රජාශක්ති ලේකම් කාර්යාලය සඳහා තාක්ෂණික උපකරණ ලබා ගැනීම

## ❄ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන 2025 සහ ප්‍රගතිය - 2025.12.31 දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 12.36 | 10.39 |
| පුනරාවර්තන | 59.64 | 51.87 |
| එකතුව | 72.00 | 62.26 |

**ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2025.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

**පුහුණු කිරීම්, පර්යේෂණ හා ප්‍රකාශන සිදු කිරීම**

- ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේ නිරත වූ අයගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකා 10 ක් හා පුහුණු වැඩසටහන් 6 ක් පැවැත්වීම
- ග්‍රාම සංවර්ධන වැඩසටහනේ නියැලී සිටින ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් සඳහා එම වැඩසටහන් වල තිරසාර බව සහතික කිරීම සඳහා පුහුණු වැඩසටහන් 8 ක් පැවැත්වීම (ග්‍රාම සංවර්ධන

සැලසුම් සකස් කිරීම, ව්‍යවසායකත්ව සංවර්ධනය, ප්‍රජා සංවිධාන කළමනාකරණය, ව්‍යාපෘති සැලසුම් කිරීම සහ කළමනාකරණය, ගෘහ කළමනාකරණය යනාදිය)

- ග්‍රාම සංවර්ධන වැඩසටහනට සම්බන්ධ ක්ෂේත්‍ර චාරිකා 6ක් සහ එක් වාර්තාවක් සකස් කිරීම
- ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ-ආර්ථික සවිබල ගැන්වීම් වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් 8 ක් පැවැත්වීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල සමාජ ආර්ථික තත්ත්වය නඟාසිටුවීම සඳහා ග්‍රාමීය සංවර්ධන සමිති ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 4 ක් පැවැත්වීම.
- ගම්මාන වල ප්‍රමුඛතා ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා ග්‍රාම සංවර්ධන සැලසුම් 254 ක් සමාලෝචනය කිරීම
- ද්විතියික දත්ත පදනම් කරගෙන වාර්තා 14ක් සකස් කිරීම
- ප්‍රජා ශක්ති සඟරාවේ වෙළුම් 2ක් ප්‍රකාශයට පත් කිරීම (අර්ධ වාර්ෂිකව නිකුත් කරනු ලබන මෙම සඟරාව ආයතනයේ වෙබ් අඩවිය හරහා සහ ෆේස්බුක් පිටුව හරහා පළ කර ඇත.)
- තරණය ප්‍රවෘත්ති ලිපියෙහි **(Tharanaya News Letter)** වෙළුම් 4ක් ප්‍රකාශයට පත් කිරීම
- ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරයට සම්බන්ධ පුහුණු මොඩියුල සකස් කිරීම සඳහා වැඩමුළු 3ක් පැවැත්වීම සහ ප්‍රගති සමාලෝචන රැස්වීමක් පැවැත්වීම. මෙහිදි සාකච්ඡා කරන ලද පුහුණු මොඩියුල එකතු කර ඉදිරි වැඩසටහන් වලට පාවිච්චි කිරීම සඳහා " සවිබලගත් ප්‍රජා නායකත්වයක් උදෙසා වන පුහුණු අත්පොත" සකස් කර ඇත.
- ධාරිතා සංවර්ධන වැඩසටහන් 5 ක් පැවැත්වීම (පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ පුහුණුව)
- පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය නිලධාරින් ප්‍රජා ශක්ති ජාතික වැඩසටහන සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම

**මේ සඳහා වියදම් කරන ලද මුළු වියදම රු.මි 4.83කි**

**ඉදිකිරීම්, මිලදී ගැනීම් හා නඩත්තු කටයුතු**

- බොරැල්ල හා පිළිමතලාව මධ්‍යස්ථාන දෙකෙහි ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම් කොළඹ හා නුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන මාරු කර , තිඹිරිගස්යාය සහ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරන ලද අතර අලුත්වැඩියා කටයුතු සිදු කර අවසන් වී ඇත

- බොරැල්ල හා පිළිමතලාව මධ්‍යස්ථාන දෙකෙහි ඡායා පිටපත් යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම.

- බොරුැල්ල හා පිළිමතලාව මධ්‍යස්ථාන දෙකෙහි වාහන අලුත්වැඩියාව සිදු කර ඇත.

- බොරුැල්ල හා පිළිමතලාව මධ්‍යස්ථාන දෙක සඳහා කාර්යාලීය උපකරණ මිලට ගැනීම.

- පිළිමතලාව මධ්‍යස්ථානයට **CCTV** කැමරා සවිකරන ලදී.

**මේ සඳහා දරන ලද මුළු වියදම රු.මි 5.88 කි.**

## ❄ උපදේශන අංශය

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන 2025 සහ ප්‍රගතිය - 2025.12.31 දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 11.30 | 10.86 |

**ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2025.12.31 දක්වා භෞතික ප්‍රගතිය**

- සමාජ විරෝධී ක්‍රියාකාරකම් සහ හැසිරීම අවදානමක් ඇති පාසල් දරුවන් හඳුනා ගැනීම හා වැඩසටහන් 1168 ක් සඳහා යොමු කිරීම (ප්‍රතිලාභීන් සංඛ්‍යාව 85,941)

- අන්තර්ජාල ඇබ්බැහිය හා මත්ද්‍රව්‍ය භාවිතය තුළින් පාසල් දරුවන් මුදවා ගැනීම සඳහා දැනුවත් කිරීමේ උපදේශන වැඩසටහන් 599ක් පැවැත්වීම (ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 58,402)

- මානසික ආබාධ කල්තියා හඳුනා ගැනීම, සත්කාර සඳහා යොමු කිරීම සහ සියදිවිනසා ගැනීම් වැළැක්වීම පිළිබඳ පාසල් දරුවන් දැනුවත් කිරීමේ උපදේශන වැඩසටහන් 930 ක් පැවැත්වීම (ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 57,215)

- තරුණ ප්‍රජාවගේ මානසික සවිබලගැන්වීම සඳහා උපදේශන වැඩසටහන් 1186ක් පැවැත්වීම. (මානසික යහපැවැත්ම, මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම, ලිංගික අධ්‍යාපනය හා සියදිවිනසා ගැනීම් වැළැක්වීම පිළිබඳ උපදේශන වැඩසටහන් ) ප්‍රතිලාභීන් සංඛ්‍යාව 60,955

- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ උපදේශන වැඩසටහන් 809 ක් පැවැත්වීම - ප්‍රතිලාභීන් සංඛ්‍යාව 31,957
- කුටුම්භය/පවුල ආශ්‍රිත ගැටලු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 1435ක් පැවැත්වීම - (ප්‍රතිලාභීන් සංඛ්‍යාව 56,884)

- පූර්ව විවාහ උපදේශන වැඩසටහන් 240 ක් පැවැත්වීම - (ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 9396)

- මනෝ සමාජීය මැදිහත්කරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ කණ්ඩායම් උපදේශන වැඩසටහන් පැවැත්වීම 372ක් ක්‍රියාත්මක කිරීම (නව යොවුන් වියේ ගැබ් ගැනීම, සියදිවි නසාගැනීම් වැළැක්වීම) - ප්‍රතිලාභීන් සංඛ්‍යාව 17,596

- මානසික ආබාධ කල්තියා හඳුනා ගැනීම, සත්කාර සඳහා යොමු කිරීම පිළිබඳ ප්‍රජාව හා නිලධාරීන් දැනුවත් කිරීමේ උපදේශන වැඩසටහන් 1255 ක් පැවැත්වීම. (ප්‍රතිලාභීන් 66,412)

- ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි වී ඇති වැඩිහිටි නිවාසවල සිටින ඩිමෙන්ශියා ආබාධ සහ අනෙකුත් වයස්ගත ආබාධ ඇති වැඩිහිටියන් සඳහා උපදේශන වැඩසටහන් 489ක් හා ලිහිලන ප්‍රතිකාර හා ක්‍රියාකාරකම් සිදු කිරීම - (ප්‍රතිලාභීන් සංඛ්‍යාව 13,755)

- අස්වැසුම ප්‍රතිලාභීන්ට ලෝක බැංකුව හරහා පුද්ගල ශක්තීන්, අභියෝග හා මත්ද්‍රව්‍ය වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 337 ක් පැවැත්වීම (ප්‍රතිලාභීන් සංඛ්‍යාව 20660) හා තනි පුද්ගල උපදේශන සැසි 299ක් පැවැත්වීම.
- අස්වැසුම ප්‍රතිලාභීන්ට ආසියානු සංවර්ධන බැංකුව හරහා පුද්ගල ශක්තීන්, අභියෝග හා මත්ද්‍රව්‍ය වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 63 ක් පැවැත්වීම (ප්‍රතිලාභීන් සංඛ්‍යාව 3484) හා තනි පුද්ගල උපදේශන සැසි 322ක් පැවැත්වීම.
- සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාකාරකම් පාදක කරගත් වැඩසටහන් 83ක් සහ තනි පුද්ගල උපදේශන සැසි 210ක් පැවැත්වීම

- වෙනත් සංවිධාන වල ඉල්ලීම පරිදි උපදේශන වැඩසටහන් 511ක් පැවැත්වීම හා තනි පුද්ගල සැසි 3198 ක් පැවැත්වීම
- තනි පුද්ගල උපදේශන සැසි 24,782ක් පැවැත්වීම සහ මැදිහත්කරණ සැලසුම් 6353 ක් සකස් කිරීම
- දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල සිටින රජයේ නිලධාරින් හා අමාත්‍යාංශ නිලධාරින් සඳහා මාසිකව ක්‍රියාකාරකම් පාදක සතිමත්බව හා ලිහිලන වැඩසටහන් 632 පැවැත්වීම (ප්‍රතිලාභින් සංඛ්‍යාව - 32,342)
- මානසික සෞඛ්‍ය සතිය පිළිබඳ උපදේශන වැඩසටහන් 23ක් පැවැත්වීම
- දුරකථන ඇමතුම් 2878 ක් හරහා දුරකථන උපදේශන සේවය ලබා දීම
- උපදේශන නිලධාරීන් සඳහා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් 2ක් පැවැත්වීම
- ජාතික ආබාධිත මහලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි වී ඇති ආබාධිත නිවාස වල සිටින ආබාධ සහිත තැනැත්තන් සඳහා ක්‍රියාකාරකම් මූලික උපදේශන වැඩසටහන් 160ක් පැවැත්වීම (ප්‍රතිලාභින් සංඛ්‍යාව - 5729)
- කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් 1 ශ්‍රේණි මනෝ උපදේශන නිලධාරින් සඳහා සති 2ක විශේෂ පුහුණු වැඩසටහනක් පැවැත්වීම
- දිත්වා සුළිකුණාටුවෙන් ආපාදාවට පත් පුද්ගලයින්ට උපදේශන සේවා ලබා දීමට ක්ෂේත්‍ර නිරික්ෂණ කිරීම
    - ප්‍රතිලාභින් 529 ක් සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය, පස්සර හා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සුරක්ෂිත මධ්‍යස්ථාන 6ක ක්‍රියාකාරකම් පාදක වැඩසටහන් 44ක් පැවැත්විය.
    - ප්‍රතිලාභින් 600ක් සඳහා නුවර දිස්ත්‍රික්කයේ ගම්පල, දෙල්තොට, පූජාපිටිය, උඩදුම්බර, දොළුව හා අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල තනි පුද්ලග උපදේශන සැසි 500ක් හා ක්‍රියාකාරකම් පාදක වැඩසටහන් 20ක් පැවැත්විය.

# ❄ ලෝක ආහාර වැඩසටහන් සහයෝගීතාව සඳහා හවුල්කාරිත්ව ලේකම් කාර්යාලය

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන 2025 සහ ප්‍රගතිය - 2025.12.31 දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 1900.00 | 985.71 |
| එකතුව | 1900.00 | 985.71 |

**ප්‍රධාන උපායමාර්ගික ප්‍රතිඵල**

1. අර්බුද සඳහා ප්‍රතිචාරය: අර්බුද අතරතුර සහ පසුව අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට ආහාර සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීම.

2. වැඩිදියුණු කළ පෝෂණය: පෝෂණ සංවේදී සහ පෝෂණ-විශේෂිත වැඩසටහන් හරහා ජීවිතයේ පළමු දින 8,000 කෙරෙහි අවධානය යොමු කරමින් පෝෂණය වැඩි දියුණු කිරීම.

3. ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම: ස්වාභාවික උපද්‍රව සහ දේශගුණික විපර්යාස සඳහා ප්‍රජා අවදානම අඩු කිරීම.

4. ආයතනික ශක්තිමත් කිරීම: ඔරොත්තු දෙන ආහාර පද්ධති සංවර්ධනය කිරීම සහ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා ජාතික ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම.

ඒ අනුව මෙම වැඩසටහන සඳහා රු.මි. 1,900 ක ප්‍රතිපාදනයක් වෙන් වී ඇති අතර 2025.12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය රු.මි.985.71 වන අතර ඉටු කර ඇති කාර්යයන් පහතින් දැක්වේ.

| | වැඩසටහනේ අරමුණ | ප්‍රධාන දායකත්වය | ප්‍රධාන ජයග්‍රහණ (2025) |
|---|---|---|---|
| 01 | ගෙවතු වගා පාසල් පෝෂණ වැඩසටහන (Home-Grown School Feeding – HGSF)<br>**දිස්ත්‍රික් ලේකම් කාර්යාල:** අනුරාධපුර,පොළොන්නරුව, මාතලේ, මඩකලපුව, මොණරාගල, නුවරඑළිය, කිළිනොච්චිය, වව්නියාව<br><br>**ප්‍රධාන ලේකම් කාර්යාල -** උතුරු පළාත, උතුරු මැද පළාත, මධ්‍යම පළාත, ඌව පළාත | පාසල් දරුවන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීම; දේශීය ගොවීන් සමඟ සබඳතා ශක්තිමත් කිරීම තුළින් ඔවුන්ගේ අදායම් මාර්ග ඉහළ නැංවීම | • පාසල් 1,850ක පාසල් ළමුන් 265,600ක් ආවරණය කරන ලදී<br>• ගෙවතු 1,590 ක්, කුකුළු ගොවිපල 1,917ක්, ආහාර සපයන්නන් 3,550 ක් සඳහා සහාය විය.<br>• සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පාසල් මුළුතැන්ගෙවල් 10 ක් ප්‍රතිසංස්කරණය කරන ලදී (කිලිනොච්චිය)<br>• බිත්තර රක්වනාගාරයක් ඉදි කිරීම (තිරප්පනේ)<br>• කුකුළු ආහාර කම්හලක් ස්ථාපිත කරන ලදී (පල්ලෙපොල / දඹුල්ල)<br>• පෝෂණ දැනුවත් කිරීම සහ සමාජ හැසිරීම් වෙනස් කිරීමේ සන්නිවේදන ව්‍යාපාර පැවැත්වීම |
| 02 | සබලකෘත සහල් බෙදාහැරීමේ වැඩසටහන | ජාතික පාසල් ආහාර වැඩසටහනට සබලකෘත සහල් ලබාදීමෙන් පාසැල් දරුවන්ගේ ක්ෂුද්‍ර පෝෂක ඌනතාවයන් සපුරාලීම. | • දිස්ත්‍රික්ක 12 ක් පුරා ළමුන් 782,044 ක් වෙත ළඟා විය<br>• කලන්කුට්ටිය සහල් සැකසුම් ඒකකය සහ ගබඩා පහසුකම් වැඩිදියුණු කරන ලදී<br>• ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ රසායනාගාරයක් සහ කාර්යාලයක් ඉදිකිරීම.<br>• පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වය හරහා මිශ්‍ර කිරීමේ යන්ත්‍ර අම්පාර හා හම්බන්තොට ස්ථාපනය කරන ලදී<br>• ආයෝජනය: නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 250 වැඩි ආයෝජනයක් කරන ලදී. |
| 03 | වත්කම් සඳහා ආහාර ආධාර (FFA) - ග්‍රාමීය ශ්‍රමය ලබා ගැනීම තුලින් වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය | ප්‍රජා වත්කම් නිර්මාණය / පුනරුත්තාපනය සඳහා මුදල්/ආහාර ආධාර ලබා දීම. | • කිලිනොච්චි සහ මාතලේ හි නිවාස 866 කට ආධාර ලබා දෙන ලදී (එක් දිස්ත්‍රික්කයකට රු. මිලියන 37.5)<br>• වත්කම් 13 ක් (වැව්, ඇළ මාර්ග, වාරිමාර්ග පද්ධති, කෘෂිකාර්මික මාර්ග) අළුත්වැඩියා කරන ලදී. ඒ තුළින් වගා නොකරන ලද ඉඩම් වගා කිරීමට හැකියාව උදාවිය. |
| 04 | ජාතික පෝෂණ අතිරේකය - ත්‍රිපෝෂ | ජාතික ත්‍රිපෝෂ අතිරේකයේ ගුණාත්මකභාවය සහ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම. | • සහල් ආශ්‍රිත විකල්ප වට්ටෝරුවක් හඳුන්වා දෙන ලදී<br>• මාස 6–36 අතර කාලයක් සඳහා සහල්–සෝයා මිශ්‍රණයක් අනුමත කර ඇත<br>• නවීන යන්ත්‍රෝපකරණ ආයෝජනය (WFP 50% + රජයේ 50% / ත්‍රිපෝෂ සමාගම) |

| | වැඩසටහනේ අරමුණ | ප්‍රධාන දායකත්වය | ප්‍රධාන ජයග්‍රහණ (2025) |
|---|---|---|---|
| **05** | Adaptation for Resilience -ADAPT4R කලාපීය ව්‍යාපෘතිය (ඉන්දියාව සහ ශ්‍රී ලංකාව) | ගොවීන් සඳහා අවසාන සැතපුම් දේශගුණික සේවා (LMCS) ශක්තිමත් කිරීම; අනුවර්තන ධාරිතාව වැඩි දියුණු කිරීම. මෙම වැඩසටහන මොනරාගල, ත්‍රිකුණාමලය, වව්නියාව, මුලතිව්, මන්නාරම හා කුරුණෑගල යන දිස්ත්‍රික් වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14ක ක්‍රියාත්මක වේ. | • සෘජු ප්‍රතිලාභීන් 15,500ක් සහ වක්‍ර ප්‍රතිලාභීන් 640,720ක් (කාන්තාවන් > 50%) ආවරණය වේ.<br>• කලාපීය දේශගුණික සහයෝගීතාව ශක්තිමත් කිරීම.<br>• ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ දේශගුණික-ප්‍රතිරෝධී ජීවනෝපායන් ප්‍රවර්ධනය කිරීම. |
| **06** | අපේක්ෂිත ක්‍රියාකාරී ව්‍යාපෘතිය (AA) – අම්පාර | ගංවතුර සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සහ පූර්වාරක්ෂාව පිළිබඳ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම. | • ශක්‍යතා අධ්‍යයනය සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අවසන් කරන ලදී<br>• නියමු ස්ථාන: සාමපුර, සේනානායකපුර, මිහිඳුපුර<br>• දිස්ත්‍රික් නිලධාරීන් 40 දෙනෙකු පුහුණු කරන ලදී<br>• ප්‍රජා දත්ත රැස් කිරීම: නිවාස 100+<br>• දිස්ත්‍රික් AA කමිටුව ආරම්භ කරන ලදී;<br>• වේගවත් ගංවතුර ආකෘතිය සැලසුම් කර ඇත |
| **07** | දිස්ත්‍රික් ආහාර සුරක්ෂිතතා ජාලය (DFSN) දිස්ත්‍රික්ක: ත්‍රිකුණාමලය, මන්නාරම, මුලතිව්, කිලිනොච්චි, යාපනය, මොණරාගල, අනුරාධපුර, වවුනියාව | දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ මට්ටමේ තිරසාර ආහාර සුරක්ෂිතතා ජාලයක් ගොඩනැගීම. | • DFSN ජාලය සහ ක්‍රියාකාරී කණ්ඩායම් ස්ථාපිත කරන ලදී<br>• දිස්ත්‍රික්ක පහක දින තුනක විශ්ලේෂණ පුහුණුවක් පවත්වන ලදී<br>• කාර්තුමය ආහාර සුරක්ෂිතතා ප්‍රකාශනය ප්‍රකාශයට පත් කරන ලදී (යාපනය)<br>• මැදිහත්වීම් සඳහා භාවිතා කරන ආහාර සුරක්ෂිතතා සිතියම් සහ වාර්තා |

# විදේශ ව්‍යාපෘති හා වෙනත් විදේශ සබදතා

## විදේශ ව්‍යාපෘති

ප්‍රධාන විදේශ ව්‍යාපෘති 3ක් මේ වන විට අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර ඉන් නියමු ව්‍යාපෘති 2ක් ණය සංරචකය යටතේ ක්‍රියාත්මක වන අතර ප්‍රදාන සංරචකය යටතේ එක් නියමු ව්‍යාපාතියක් ක්‍රියාත්මක වේ.

ණය සංරචකය යටතේ බහුමාන දරිද්‍රතාවයට මුහුණ පා ඇති පවුල් සංඛ්‍යාව අවම කිරීම අරමුණු කරගනිමින් අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන මෙම අමාත්‍යාංශය යටතේ ඇති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන වැඩසටහනක් වන අතර එහි නියමු ව්‍යාපෘති 02 ක් ලෙස ලෝක බැංකු ණය ආධාර හා ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ මේ වන විට ක්‍රියාත්මක කිරීම ආරම්භ කරඇත.

ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර ව්‍යාපෘතිය මඟින් අස්වැසුම ප්‍රතිලාභීන් සවිබලගැන්වීමේ වැඩසටහනේ නියමු ව්‍යාපෘතියක් ලෙස ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර යොදා ගනිමින් අස්වැසුම ප්‍රතිලාභීන් අතරින් දිළිඳු හා අන්ත දිළිඳු පවුල් 12,800 ක් සවිබලගැන්වීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වේ.

ආහාර සුරක්ෂිතතාවය හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ මේ සඳහා ප්‍රතිපාදන වෙන් වන අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. මෙය 2022.09.09 වර්ෂයේ සිට 2026.08.29 දක්වා ක්‍රියාත්මක වීමට නියමිතව ඇති අතර එහි ඇස්තමේන්තුගත මුළු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 7 කි.(2025 වසර සඳහා රු.මි 1685.00 කි.) මේ යටතේ අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර, මාතලේ, නුවරඑළිය, කුරුණෑගල, කෑගල්ල, කළුතර, යාපනය, කිලිනොච්චි, මුලතිවු, ත්‍රිකුණාමලය, මඩකලපුව යන දිස්ත්‍රික්ක ආවරණය වේ.

මෙම ව්‍යාපෘතියට අදාලව රුපියල් මිලියන 1236.55 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

මීට අමතරව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින සමනලවැව හා නිල්ලඹ පිහිටි පුහුණු කිරීමේ මධ්‍යස්ථාන වල අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇත.

ලෝක බැංකු මූල්‍යාධාර ව්‍යාපෘතිය යටතේ අස්වැසුම ප්‍රතිලාභීන් සවිබලගැන්වීමේ වැඩසටහනේ නියමු ව්‍යාපෘතියක් ලෙස ලෝක බැංකු මූල්‍යාධාර යොදාගනිමින් අස්ඇසුම ප්‍රතිලාභීන් අතරින් දිළිඳු හා අන්ත දිළිඳු පවුල් 10, 975 ක් සවිබලගැන්වීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය 2023.12.14 සිට 2027.09.30 දක්වා ක්‍රියාත්මක වීමට නියමිතව ඇති අතර මේ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 8 ක් වෙන් කර ඇත. (2025 වසර සඳහා රු.මි 1,118 ක් ලැබී ඇත.)මෙම ව්‍යාපෘතිය මඟින් ගාල්ල, මාතර, හම්බන්තොට, ගම්පහ පුත්තලම, කොළඹ, මොණරාගල, මන්නාරම, බදුල්ල, අම්පාර, රත්නපුර හා වවුනියාව යන දිස්ත්‍රික්ක ආවරණය වේ.

මෙම ව්‍යාපෘතියට අදාලව රුපියල් මිලියන 27.31 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර ඒ යටතේ ව්‍යාපෘති සැලසුම්කරණය හා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ හා බඳවා ගැනීමේ කටයුතු අවසන් කර ඇත. එමෙන්ම බඳවා ගන්නා ලද පවුල් සඳහා පවුල් සංවර්ධන සැලසුම් 4,553 ක්, ව්‍යාපාරික සැලසුම් සහ රැකියා සැලසුම් සකස්කිරීම අවසන් කොට ඇත.

ප්‍රදාන සංවරකය ලෙස ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 1.98 ක ප්‍රදාන සංවරකයක් ක්‍රියාත්මක වන අතර එය 2022 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා ක්‍රියාත්මක වීමට නියමිතය. මෙහිදී මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය, සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය යටතේ මෙම අමාත්‍යාංශයට අදාල ආයතන සඳහා රුපියල් මිලියන 146.985 ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර 2022.09.09 සිට 2025.12.31 දක්වා රුපියල් මිලියන 50.875 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත. එයට අදාල භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

- අකුරැස්ස ළමා රැකවරණ මධ්‍යස්ථානය සඳහා ලී බඩු හා උපකරණ ලබා දී ඇත.
- රැකවරණ මධ්‍යස්ථාන 30 ක් සඳහා උපකරණ ලබා දී ඇති අතර රැකවරණ මධ්‍යස්ථාන 11ක අළුත්වැඩියා කටයුතු සිදු කර ඇත.
- ආබාධිත පුද්ගලයින් 550 ක් සඳහා උපදේශන වැඩසටහන් 11ක් පවත්වා ඇත.
- ආබාධිත දරුවන් සඳහා පාසල් උපකරණ කට්ටල 472ක් ලබා දී ඇත.
- ආබාධිත පුද්ගලයන් 61 දෙනෙකු සඳහා ජංගම අලෙවි රථ ලබා දී ඇත.
- ආබාධිත පුද්ගලයන් 721 ක් සඳහා රැකියා පුහුණු වැඩසටහන් සිදු කර ඇත.
- ආබාධිත පුද්ගලයන් 20 ක් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දී ඇත.
- ආබාධිත පුද්ගලයන් රැකබලා ගැනීම සම්බන්ධයෙන් ඔවුන්ගේ නිවෙස් වල සිටින පුද්ගලයින් 1477 ක් සඳහා පුහුණු වැඩසටහන් සිදු කර ඇත.
- වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන වල ස්වයං රැකියා පුහුණුවලත් ප්‍රතිලාභින් 8ක් සඳහා උපකරණ ලබා දී ඇත.
- දෘශ්‍යාබාධිත පුද්ගලයන් 13ක් සඳහා ජීවනෝපාය ආධාර ලබා දී ඇත.

මෙම සියලු විදේශ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධීකරණය හා අධීක්ෂණ කටයුතු අමාත්‍යාංශයේ සැලසුම් හා මෙහෙයුම් අංශය මඟින් 2025 වසරේදී සිදු කරන ලදී.

## 4.11.2 විදේශ සබඳතා

**දිළිඳුකම තුරන්කිරීම සහ තිරසර සංවර්ධනය පිළිබඳ අන්තර් - රාජ්‍ය විශේෂඥ කමිටුවේ පළමු රැස්වීම**

තිරසර සංවර්ධන ඉලක්ක සමඟ අනුගතවීම සහ දිළිඳුකම පිටු දැකීම සඳහා වූ 2024 සාර්ක් ක්‍රියාකාරි සැලැස්ම නැවත සලකා බැලීම පිළිබඳ වූ සාර්ක් – ආසියානු සංවර්ධන බැංකු උපදේශන වැඩමුළුව 2024 ඔක්තෝම්බර් 21 සහ 22 දින නේපාලයේ කත්මණ්ඩුවේ දී පැවැත්විය.එම රැස්වීමේදී දිළිඳුකම තුරන් කිරීම සහ තිරසර සංවර්ධනය පිළිබඳ අන්තර් - රාජ්‍ය විශේෂඥ කමිටු පළමු රැස්වීම සඳහා සත්කාරත්වය සැපයීමට ශ්‍රී ලංකාව එකඟ විය. ඒ අනුව එම හමුව 2025 පෙබරවාරි 18 සහ 19 දින කොළඹ අමාරි හෝටලයේ දී ආසියානු සංවර්ධන බැංකුවේ ආර්ථික හා තාක්ෂණික සහාය ඇතිව පැවැත්විණි. ඉන්දියාව හැර අනෙකුත් රටවල් සියල්ලේ නියෝජිතයන් මෙම හමුවට සහභාගි විය.ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය සාර්ක් මහ ලේකම් කාර්යාලය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සහයෝගිත්වයෙන් මෙම රැස්වීම සංවිධානය කරන ලදී. මේ සඳහා සාර්ක් රටවල්, සාර්ක් මහ ලේකම් කාර්යාලය සහ ආසියානු සංවර්ධන බැංකුවේ නියෝජිතයන් ඇතුළු 34 දෙනෙකුගෙන් සමන්විත සමස්ත නියෝජිත පිරිසක් මීට සහභාගි විය. ගෝලීයව සාර්ක් ඉලක්ක හා දර්ශක සැලකිල්ලට ගනිමින් සාර්ක් කලාපය සඳහා සලකා බලන ලද ඉලක්ක හා දර්ශක, දිළිඳුකම පිටු දැකීම සඳහා වන සාර්ක් සැලැස්ම, සාර්ක් සංවර්ධන ඉලක්ක,සලකාබලන ලද තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රමුඛතා ප්‍රතිපත්ති, සලකා බලන ලද තිරසර සංවර්ධන සඳහා අධීක්ෂණ යාන්ත්‍රණය හා කාලීනව ඇගයීම් කිරීම ඇතුළත් කරන ලද අවසාන කෙටුම්පත් වාර්තාව මෙම රැස්වීමේදී සාකච්ඡාවට භාජනය කළ අතර සාර්ක් සාමාජික රටවල දිළිඳුකම තුරන් කිරීම සඳහා වන වැදගත් තීරණ මෙහිදී ගනු ලැබිණි.මූලික වියදම් ආසියානු සංවර්ධන බැංකුව විසින් දරනු ලැබූ අතර මෙම රැස්වීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් අනෙකුත් වියදම් වෙනුවෙන් රු.මි. 0.64 ක වියදමක් දරන ලදී.

**දිළිඳුකම පිටුදැකීම පිළිබඳ BIMSTEC (Bay Bengal Initiative for Multi-Sectoral Technical and Economic Cooperation) විශේෂඥ කණ්ඩායම් හතරවන රැස්වීම - 2025.10.09 හා 10 දෙදින**

දරිද්‍රතාවය පිටුදැකීම වෙනුවෙන් BIMSTEC අමාත්‍යවරුන්ගේ රැස්වීම, BIMSTEC ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම, BIMSTEC විශේෂඥ කණ්ඩායම් රැස්වීම ලෙස BIMSTEC කලාපීය රටවල් එක්ව වාර්ෂික සමුළු පවත්වනු ලබන අතර, ඉන් BIMSTEC විශේෂඥ කණ්ඩායමේ 4 වන රැස්වීම බත්තරමුල්ල, වෝටර්ස් ඒඩ්ජ් හෝටලයේ දි 2025.09 හා 10 දෙදින පවත්වන ලදී.

දරිද්‍රතාවය පිටුදැකීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම ඇතුළුව, BIMSTEC කලාපීය රටවල් වල සහයෝගීතාවයෙන් දරිද්‍රතාවය සහ දරිද්‍රතාවය පිටුදැකීමේ වෙනුවෙන් කටයුතු කිරීම සඳහා සන්නිවේදන ක්‍රියාවලීන්, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ප්‍රගතිය සමාලෝචනය කරන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත දිළිඳුකම පිටුදැකීම පිළිබඳ BIMSTEC විශේෂඥ කණ්ඩායම් වසරකට වරක් රැස්වේ.

2024 වර්ෂයේ නේපාලයේ කත්මන්ඩු නුවර පැවති 3 වන සමුළුවේ දී යෝජනා වූ පරිදි 4 වන සමුළුව 2025.1.09.10 දෙදින පවත්වන ලදී. බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය, ශ්‍රී ලංකාව හා තායිලන්තය BIMSTEC හි සාමාජික රටවල් වන අතර, ශ්‍රී ලංකාවේ පැවැති 4 වන සමුළුව සඳහා මියන්මාරය එක් නිලධාරියකු හා තයිලන්තයේ නිලධාරින් 05 දෙනකු සහභාගී වූ අතර බංගලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය අන්තර්ජාලය හරහා Zoom ඔස්සේ රැස්වීම් සඳහ සහභාගී විය.

මෙම සමුළුව BIMSTEC ලේකම් කාර්යාලය විසින් මෙහෙයවන, අතර BIMSTEC ලේකම් කාර්යාලය නියෝජනය කරමින් විදේශීය සාමාජිකයන් දෙදෙනකු රැස්වීම සඳහා සහභාගී වන ලදි. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ගාමිණී විජේසිංහ මහතාගේ සභාපතීත්වයෙන් යුතුව පවත්වන ලද මෙම සමුළුව සඳහා ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශ නිලධාරින් හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරින් සහභාගි වන ලදී.


මෙම වැඩසටහන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අනුමත ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත්ව ඇති අතර, මෙම කටයුතු සඳහා දරන ලද වියදම රු.මි. 2.39 වේ.

## අභියෝග

1. ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය මට්ටමින් නිලධාරී නොමැති අතර සමාජ සේවා නිලධාරීන් මඟින් රාජකාරී ඉටු කරගැනීමට යාමේදී ඍජුව විධාන දීමේ ගැටළුකාරී තත්ත්වයක් පවතී .
2. අමාත්‍යාංශයට අදාළ සියළු නිලධාරීන් සඳහා අන්තර්ජාල හා පරිගණක පහසුකම් අවමවීම නිසා ප්‍රාදේශීය මට්ටමින් දත්ත ලබා ගැනීමේදී ප්‍රමාදයන් සිදුවීම.
3. අමාත්‍යාංශයේ ඇතැම් ආයතනවල පවතින නිලධාරී හිඟය.
4. වැඩිහිටියන් නිවාසගතවීමේ ප්‍රවණතාවය වර්ධනය වීම හේතුවෙන් ඊට සාපේක්ෂව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ දුෂ්කරතා.
5. ඇතැම් ප්‍රදේශිය ලේකම් කාර්යාලයන්හි පවතින ග්‍රාම නිලධාරි වසම් ප්‍රමාණය විශාල බැවින් විෂයය ආවරණය කිරීම සඳහා අනුමත ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රමාණවත් නොවීම.
6. ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදූව ප්‍රදේශයේ ඉදිවන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් අවසන් නොවීම හේතුවෙන් වැඩි සිසුන් ප්‍රමාණයක් සඳහා පාඨමාලා පැවැත්වීමේ ඉඩ පහසුකම් සීමාවීම.
7. ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු පිරවීමේ ඉඩකඩ සීමාවීම හේතුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන අංශයට අදාළ රාජකාරී කාර්යක්ෂම කිරීමේ ගැටලු මතුවීම.
8. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රවර්ධනය කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් නොවීම සහ රාජ්‍ය චක්‍රලේඛ මඟින් වියදම් සිමාවන් පැනවීම.
9. විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයන්ගේ වාරික මුදල් සාපේක්ෂව ඉහළ අගයක පැවතීම හේතුවෙන් ස්වයං රැකියා නියුක්තික අඩු අදායම්ලාභීන් ඒ සඳහා රාජ්‍ය මූල්‍ය දායකත්වය අපේක්ෂා කිරීම.
10. 2025 වසරේ නොවැම්බර් මස ඇති වූ දිත්වා සුළි කුණාටුව හේතුවෙන් බොහෝ ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වීම

## ඉලක්ක

1. පුරවැසියන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය.
2. ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ පවතින සමිති සතු අරමුදල් සක්‍රිය සංසරණයට යෙදවීම.
3. 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සංශෝධනය අවසන් කිරීම.
4. සංඥා භාෂා පනත් කෙටුම්පත අනුමත කර ගැනීම
5. ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම
6. දැනට සංශෝධිත මට්ටමේ පවතින ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් සැපයීමේ ගැසට් පත්‍රයේ කටයුතු අවසන් කිරීම
7. ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් පවත්වනු ලබන පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයක් (Internal Quality Assurance Unit) පිහිටුවා පවත්වාගෙනයාම.
8. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කටයුතු පුළුල් කිරීම සඳහා නව පාඨමාලා ආරම්භ කිරීමේ අවශ්‍යතාවය ඇති අතර දැනට පවතින අංශයන් (Divisions) අධ්‍යයන අංශ (Departments) ලෙස නම් කර ආයතනයෙහි ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීම.
9. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ආයතනයේ අධ්‍යයන කටයුතු තවදුරටත් පුළුල් කරමින් උසස් පෙළ සමතුන් වැඩි පිරිසකට උසස් අධ්‍යාපනය ලබාදීමේ අරමුණින් ආයතනය විශ්ව විද්‍යාලයක් බවට පත්කිරීමට කටයුතු කිරීම.
10. විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීම පුළුල් කිරීම හා ප්‍රතිලාභ පුළුල් කිරීම.
11. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයෙහි ලේඛන ඩිජිටල්කරණය කිරීම මඟින් සේවා කාර්යක්ෂම කිරීම
12. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන අවස්ථා පුළුල් කිරීම මඟින් සේවා ඵලදායිතාවය ඉහළ නැංවීම
13. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රතිලාභින් සඳහා වඩා ඵලදායි ආකාරයෙන් සිදුකරගෙන යාම උදෙසා ඩිජිටල්කරණය වූ අධීක්ෂණ වැඩ රාමුවක් සකස් කොට පවත්වාගෙන යාම.
14. " ප්‍රජා ශක්ති" දිළිඳුබව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම



# පරිච්ඡේදය 03

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

### 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | තත්‍ය 2025 රු. | තත්‍ය 2024 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 812,534,032 | - | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 31,328,826 | - | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 28,213,556 | - | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 139,667,883 | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,011,744,297** | - | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,011,744,297** | - | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 44,457,887 | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **967,286,410** | - | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 659,430,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 618,932,949 | - | ඒසීඒ-2 |
| 302,627,827 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 209,296,268 | - | ඒසීඒ-2 |
| 878,800,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 762,762,687 | - | ඒසීඒ-2 |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2 |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2 |
| 1,840,957,827 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **1,590,991,904** | - | |
| | **මූලධන වියදම්** | | | | |
| 26,600,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 22,105,244 | - | ඒසීඒ-2 |
| 201,880,830 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 40,066,725 | - | ඒසීඒ-2 |
| 4,775,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 2,053,353,624 | - | ඒසීඒ-2 |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2 |
| 1,350,000 | හැකියා වර්ධනය | 14 | 1,023,639 | - | ඒසීඒ-2 |
| 116,295,000 | වෙනත් මූලධන වියදම් | 15 | 23,910,857 | - | ඒසීඒ-2 |
| 5,121,125,830 | **මුළු මූලධන වියදම් (උ)** | | **2,140,460,089** | - | |
| | තැන්පතු ගෙවීම් | | 29,534,707 | - | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 94,177,401 | - | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 123,712,108 | - | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 3,855,164,101 | - | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (2,887,877,691) | - | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (2,887,877,691) | - | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | | ඒසීඒ-3 |
| | | | - | - | |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | | | ඒසීඒ-පී |
|---|---|---|---|
| 2025 දෙසැම්බර් 31 දිනට | | | |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය** | | | |
| | **සටහන** | **තත්‍ය** | |
| | | **2025** | **2024** |
| | | **රු.** | **රු.** |
| මූල්‍ය නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,530,851,705 | - |
| මූල්‍ය වත්කම් | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 65,963,845 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | **1,596,815,550** | - |
| | | | |
| ශුද්ධ වත්කම් /ස්කන්ධය | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 10,133,519 | - |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,530,851,705 | - |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | | - | - |
| | | | |
| ජංගම වගකීම් | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 55,830,326 | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | **1,596,815,550** | - |

පිටු අංක 54 සිට 55 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 56 සිට 59 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ................................<br>ප්‍රධාන ගණන්දීමේ නිලධාරි<br>නම :<br>තනතුර :<br>දිනය : 2026 . 02. 27<br><br>සම්පත් මන්ත්‍රීනායක<br>ලේකම්<br>ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ<br>ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br>01වන මහල. අදියර II. සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල. | ................................<br>ගණන්දීමේ නිලධාරි<br>නම :<br>තනතුර :<br>දිනය : 2026. 02. 27 | ................................<br>ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/<br>අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)<br>නම :<br>දිනය : 2026 . 02 . 25<br><br>ඩබ්ලිව්.එම්.ඩී. බණ්ඩාර<br>ප්‍රධාන මූල්‍ය නිලධාරි<br>ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ,සහ<br>ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br>01 වන මහල, 2 වන අදියර, සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල |

2

### 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | | |
|---|---|---|
| | | **ඒසීඒ-සී** |
| **2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | |
| | | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය** | | |
| | | |
| | **තථ්‍ය** | |
| | | **සංශෝධිත** |
| | **2025** | **2024** |
| | **රු.** | **රු.** |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 61,803,989 | - |
| අග්‍රිම ලැබීම් | 812,534,032 | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 92,830,781 | - |
| තැන්පතු ලැබීම් | 31,328,826 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **998,497,628** | **-** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |

| | | |
|---|---|---|
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 448,586,103 | - |
| සහනාධාර සහ මාරුකිරීම් | 213,462,961 | - |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | 259,608,353 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 8,484,025 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 44,457,887 | - |
| අත්තිකාරම් ගෙවීම් | 93,964,748 | - |
| තැන්පතු ගෙවීම් | 29,534,707 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **1,098,098,785** | **-** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **(99,601,157)** | **-** |
| | | |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | **-** | **-** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 40,066,726 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **40,066,726** | **-** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(40,066,726)** | **-** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(139,667,883)** | **-** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | 139,667,883 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | **139,667,883** | **-** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | **-** | **-** |

| | | |
|---|---|---|
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඍ)-(එ) | 139,667,883 | - |
| | | |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

**3.5** මූල්‍ය ප්‍රකාශ සටහන් - අදාළ නොවේ

**3.6** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - අදාළ නොවේ

**3.7** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මූල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,841,300,000 | 1,840,724,170 | 1,590,991,903 | 86% |
| ප්‍රාග්ධන | 4,917,700,000 | 5,121,125,830 | 2,140,460,089 | 42% |

**3.8** මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මූල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට | | 4,679,750,000 | 4,878,458,598 | 2,587,990,864 | |
| 2. | සෞඛ්‍ය අමාත්‍යාංශයට | | 500,000,000 | 500,000,000 | 95,905,495 | |

**3.9.** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේතය | 31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 88,313,100 | 88,313,100 | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 402,112,045 | 402,112,045 | - | - |
| 9153 | ඉඩම් | 86,300,000 | 86,300,000 | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 954,126,559 | 954,126,559 | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ්/ඩී/එම්එස්ආර්/එෆ්එස්/2025

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026 ජූනි 16 දින

ලේකම් කාර්යාලය
22 JUN 2026

ප්‍රධාන ගණන්දීමේ නිළධාරී
ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

**ශීර්ෂය 124 - ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - 01. ලේකම් - ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය

02.ලේකම් - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. එල්එස්ඩබ්/ඩී/ එම්එස්ඊ /එෆ්එස්/2025 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2026 ජුනි 16දින |

ප්‍රධාන ගණන්දීමේ නිළධාරී
ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

**ශීර්ෂය 124 - ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 124 - ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අත්තිකාරම් ගෙවීම්

(අ) 2025 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොවී ඇති විශ්‍රාම ගනු ලැබූ නිලධාරීන්ගේ ණය ශේෂය රු.284,727 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවය අතහැර ගොස් ඇති නිළධාරින්ගෙන් අය විය යුතු වසර 01 ඉක්ම වූ ණය ශේෂයෙන් 2026 මැයි 30 වනවිට තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු.467,671 ක් විය.

### 1.6.2 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් අත්තිකාරම් "බී"ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් රු.510,406 ක් වුවද දෙපාර්තමේන්තු පොත් අනුව රු.358,579ක් වූයෙන් රු.151,827 ක් වැඩියෙන් දක්වා තිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 4.4 (ආ) | 2014 වර්ෂයේ දී ජීප් රථයක් අනතුරකට භාජනය වීම සම්බන්ධයෙන් මු.රෙ.104(4) ට පටහැනිව අනතුර සිදුවී වසර 10 කට පසු එනම් 2024 ජනවාරි 02 දින පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර තිබූ අතර එහි සිදුවූ අලාභය පිළිබඳ තක්සේරු කර නොතිබුණි. තවද අනතුර සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයෙකුගේ වාර්තාවක් ද ලබාගෙන නොතිබුණි. වගකවයුතු පාර්ශවයන් විසින් වාහන අනතුරට පත් වීමෙන් පසු නියමිත කාලවකවානු තුළ හානිපූර්ණය කිරීම සම්බන්ධයෙන් ගතයුතු නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා මෙහි අලාභය ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි වී තිබුණු අතර 2024 දෙසැම්බර් 18 දින වන විටත් ජීප් රථය අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | 4.4(අ) |

## 3. මූල්‍ය සමාලෝචනය .

### 3.1 වියදම් කළමනාකරණය

(අ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 02/2025 හි 3.4 ඡේදය ප්‍රකාරව ශුද්ධ ප්‍රතිපාදනය හා වියදම අතර වෙනස රු.10,000 හෝ සියයට 5 ට වැඩි සෑම වැය විෂයයකටම හේතු දැක්විය යුතු වුවද වැඩසටහන් 1 හා 2 හි වැය විෂයයන් 12 ක ශුද්ධ ප්‍රතිපාදනය එකතුව රු.591,530,000 ක් ද වියදම් එකතුව රු. 113, 942,954 ක් ද හා ඉතිරිය රු. 468,097,323 ක් විය.මෙම වෙනස සියයට 23 සිට 83 දක්වා පරාසයක තිබුණද හේතු දක්වා නොතිබුණි. සමස්තයක් ලෙස අමාත්‍යාංශයේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 46 ක් ඉතිරිව තිබුණි.

(ආ) අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා රු.7,330,020 ක පුනරාවර්තන ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.1,122,951 ක් පමණක් වැයකර තිබුණු අතර මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ රු.250,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

### 3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයට අදාලව බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු රු.3,086,733 ක් බැරකම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

### 3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතනත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 (1) (අ) , | පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | |
|---|---|
| | දැනගැනීම හා එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කිරීම සිදුකල යුතු වුවද අනතුරට පත්වූ වාහන 15 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104(3) | ප්‍රාරම්භක වාර්තාව දින 07 ක් ඇතුළත එවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අනතුරට ලක් වූ වාහන 15 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා දින 11 සිට දින 86 ක් දක්වා ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණු අතර ප්‍රාරම්භක පරීක්ෂණ සඳහා නිලධාරීන් පත් කිරීම ද ප්‍රමාද වී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 104 (4) | පූර්ණ වාර්තාව අලාභ හානිය සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවද වර්ෂය තුළ අනතුරට පත් වාහන 05ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීම මාස 03 සිට මාස 07 දක්වා කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර සංවර්ධනයේ ප්‍රතිලාභ සමානව භුක්තිවිඳින සුපෝෂිත සමාජයක් හා ග්‍රාමීය සංවර්ධනය වැඩිදියුණු කිරීම, සමාජ ආරක්ෂණය සහ සවිබල ගැන්වීම සහතික කිරීම සඳහා සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම වුවද ඒ සඳහා සියලුම අංශ සමාන දායකත්වයක් ලබා දී නොතිබුණි.

#### 4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) උපදේශන අංශය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ජාතික උපදේශන වැඩසටහන වැය ශීර්ෂය යටතේ රු.මිලියන 10 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව අංශ 07 ක් යටතේ කාර්යයන් 25 ක වැඩසටහන් 12,905 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. එයින් එක් වැඩසටහනක කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණු අතර වැඩසටහන් 09 ක කාර්ය සාධනය සියයට 10 සිට සියයට 66 ක පරාසයක විය. වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කළහැකි වැඩසටහන් ප්‍රමාණය හා ආයතනය සතු මානව සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මෙහෙයවීම සම්බන්ධයෙන් කළමණාකරණය අවධානය යොමු කර නොතිබුණි.

(ආ) සේවකයන්ගේ කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් 03 ක් තුළින් සේවකයන් 149 කගේ ධාරිතා සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් සේවකයන් 98 ක් වෙනුවෙන් වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබුණි.

(ඇ) ග්‍රාමීය සංවර්ධන කාර්යංශය යටතේ ව්‍යාපෘති ශක්‍යතාව සහ ශක්‍යතාව සඳහා ක්ෂේත්‍ර චාරිකා තුළින් වාර්තා 50 ක් නිකුත් කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් ඇගයීම් වාර්තා 23ක් පමණක් නිකුත් කර තිබුණි. අදාල කාලපරිච්ඡේදය තුළ නිම කළ හැකි කාර්යයන් ප්‍රමාණය නිසි පරිදි සැලසුම් කිරීමේ හා මෙහෙයවීමේ දුර්වලතා හේතුවෙන් මෙම කාර්යයන් ඉටුකර නොතිබුණි.

### 4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පිළිමතලාව පුහුණු පර්යේෂණ ආයතනය විසින් රු.203,575 ක් වැය කර 2023 වර්ෂයේ සිට 2025 දක්වා විවිධ විශේෂිත ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකර තිබුණ ද පර්යේෂණ කමිටුවේ නිර්දේශ අනුව පර්යේෂණ වාර්තාවක ඇතුළත් විය යුතු පිළිගත් නිර්ණායක අනුගමනය කර නොතිබීම හා අඩංගු කරුණු ප්‍රමාණාත්මක නොවීම හේතුවෙන් මෙම පර්යේෂණ හා අධ්‍යනයන්හි ගුණාත්මකභාවය අවම මට්ටමක පැවති අතර ආයතනයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

### 4.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (2025-2029) වර්ෂයන්ට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහය 01/2025 හි 03 ඡේදය පරිදි "ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශය මගින් ග්‍රාමීය හා වතු ප්‍රදේශවල බහුමාන දරිද්‍රතාවය තුරන් කිරීම "සමස්ත අරමුණ ඉටු කිරීම සඳහා අවම වශයෙන් ග්‍රාම නිලධාරී වසම් 1,000ක වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණද ග්‍රාම නිලධාරී වසම් 260 ක් සඳහා ක්‍රියාත්මක කිරීමට අනුමත කළ වැඩසටහන් ගණන 193ක් විය.

(ආ) අවශ්‍යතාවයන් මනාව අධ්‍යයනය කිරීමෙන් තොරව ව්‍යාපෘති වාර්තා සකස්කිරීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතින ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කර නොතිබීමෙන් ව්‍යාපෘති වාර්තා සකස්කර මුදල් අනුමත කිරීමෙන් අනතුරුව ව්‍යාපෘති 10 ක සඳහන් ඇතැම් කාර්යයන් / ඇතැම් උපකරණ සංශෝධනය කර ව්‍යාපෘතිය සිදු කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණු අතර මාර්ගෝපදේශ සංග්‍රහය 01/2025 හි 03 ඡේදය පරිදි ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශය මගින් ග්‍රාමීය හා වතු ප්‍රදේශවල බහුමාන දරිද්‍රතාවය තුරන් කිරීම සමස්ත අරමුණ ඉටු කිරීම සඳහා රජයේ කිසිදු ප්‍රතිපාදනයක් ලබා දී නොතිබුණු ප්‍රතිලාභීන් කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

### 4.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) ප්‍රාග්ධන මාරුකිරීම් වැය විෂය යටතේ සංවර්ධන සහායන් සඳහා ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන වැඩසටහන වෙනුවෙන් මූල්‍යකරණය විදේශ ණය මගින් රු.998,000,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.21,739,406 ක් පමණක් වැය කර තිබුණු අතර රු.976,260,594 ක් එනම් සියයට 98 ක් ඉතිරි වී තිබුණි. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම මත ව්‍යාපෘති අංශයේ යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය තාක්ෂණික උපාංග මිලදී ගැනීමට වෙන් කළ මුදල් වැය නොවීම, මෙම වැඩසටහන සඳහා මූල්‍යකරණ ප්‍රභවයේ පිරිවැය පිළිබඳ සැලකිල්ලක් නොදක්වා කළමණාකරණ තීරණගැනීමේ දුර්වලතා හේතුවෙන් මෙම ඉතිරිවීම් සිදුවී තිබුණි.

(ආ) ප්‍රාග්ධන මාරුකිරීම් වැය විෂය යටතේ සංවර්ධන සහායන් සඳහා සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය (ලෝක බැංකුව- ශ්‍රී ලංකා රජය) වෙනුවෙන් මූල්‍යකරණය ප්‍රතිපාර්ශවීය අරමුදල් මගින් වූ රු.40,000,000 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

### 4.2. විදේශ ආධාර ව්‍යාපෘති

(අ) ලෝක ආහාර වැඩ සටහන යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් වල්ගම් වැව වසමේ පිහිටි 'කොරගහ වැව' එම ප්‍රදේශයට අයත් ගොවි සංවිධාන සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වය සෘජුව ලබාගෙන ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් ලබා දී තිබුණු රු.5,400,000 කට ආසන්න මුදලක් එම සාමාජිකයින්ගේ බැංකු ගිණුම් වලට බැර කරගෙන තිබුණු අතර 2025 පෙබරවාරි 7 දිනැති අංක MRDSS/ & SS/PSWFPC/03/01/03 දරන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මගින් යොමු කර තිබුණු මාර්ගෝපදේශයන්ට අනුගත නොවී ඉන් කොටසක් එකතු කර පුද්ගලික ආයතනයක් මගින් යන්ත්‍ර සූත්‍ර හා වාහන කුලියට යොදා අදාල ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරගෙන තිබූ අතර අදාළ කාර්යය අවසන් කර නොතිබුණි.

(ආ) මාතලේ දිස්ත්‍රික්කයට අයත් වැව් හා ඇල මාර්ග 7 ක ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එම ප්‍රදේශවල තෝරාගත් එක් එක් ගොවි සංවිධාන වෙත රු.7 960,269 ක් වටිනා භාණ්ඩ හා උපකරණ කට්ටල 25 ක් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකළ 2025 ජුනි සිට ඔක්තෝබර් 18 දක්වා කාලයෙන් පසුව 2025 ඔක්තෝබර් 21 සිට 28 දක්වා කාලය තුළ බෙදා දී තිබුණි. එක් එක් ගොවි සංවිධානයේ අවශ්‍යතාවය නොසලකා බෙදා දී තිබුණු උපකරණ වලින් රු. 1,222,698 ක භාණ්ඩ හා උපකරණ නිෂ්කාර්යව පැවතුණි. ප්‍රතිසංස්කරණ කටයුතු හා ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කිරීමේ දුර්වලතා හේතුවෙන් භාණ්ඩ හා උපකරණ කට්ටල නිෂ්ක්‍රීයව පැවැතිම හා ඒ සඳහා වැය කල වියදම නිෂ්කාර්ය වී තිබුණි.

(ඇ) 2023 මැයි 19 දිනැති අංක 24/2023 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාරව නිරෝගී ක්‍රියාශීලී දරුපරපුරක් තේමාව යටතේ ක්‍රියාත්මක පාසල් පෝෂණ වැඩසටහන සඳහා චක්‍රලේඛයේ අංක 15 යටතේ ගෙවතු වගා පාසල් පෝෂණ වැඩසටහන 2024 වර්ෂයේ සිට මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11ක තෝරාගත් පාසල් 09 ක ක්‍රියාත්මක කර තිබුණි. පාසල් පෝෂණ ආහාර සැපයුම්කරුවන්ට එළවළු, පළතුරු හා බිත්තර සැපයීම සඳහා තෝරා ගන්නා ලද ගෙවතු වගා හා කුකුළු පාලන ව්‍යාපෘති ප්‍රතිලාභීන්ට ලෝක ආහාර වැඩසටහන යටතේ තාක්ෂණික හා මූල්‍යාධාර සැපයීම සිදුකර තිබුණි. ඒ සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් කෙරේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහනේ අධීක්ෂණ, පුහුණු හා පරිපාලන වියදම් සඳහා වූ වැය විෂය යටතේ මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කට රු.3,440,000 ක් ලබා දී තිබුණු අතර ඉන් පුහුණු වැඩසටහන් 28 ක් හා ප්‍රගති සමාලෝචන රැස්වීම් 40 ක් සඳහා රු. 2,294,206 ක් වැයකර තිබුණි.

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව 2025 ඔක්තෝබර් තුළ පාසල් පෝෂණ ව්‍යාපෘතියේ කුකුළු පාලන ව්‍යාපෘති 208 ක කිකිලියන් 8,315 ක ගේ මුළු බිත්තර නිෂ්පාදනය 209,305 ක් වූ අතර ඉන් බිත්තර 56,177 ක් පමණක් පාසල් සඳහා ලබා දී තිබීමෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණි.

(iii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ගෙවතු වගා ප්‍රතිලාභීන් 12 දෙනෙකු හා කුකුළු පාලන ව්‍යාපෘති ප්‍රතිලාභීන් 18 දෙනෙකු විසින් ඔක්තෝබර් තුළ පාසල් 09 කට එළවළු, පළතුරු හා බිත්තර සැපයීමේදී , ප්‍රතිලාභීන් පදිංචිය හැර යාම, අදාල මාසය තුළ වගා කටයුතු සිදුකර නොතිබීම, වගා නිෂ්පාදන පාසල් සැපයුම්කරුවන්ට ලබා නොදී විකුණා තිබීම, පාසල් සැපයුම් කරුවන් නිෂ්පාදන ප්‍රතික්ෂේප කිරීම, නිලධාරීන් විසින් ව්‍යාපෘති ප්‍රතිලාභීන් නොවන පුද්ගලයින්ට කෘෂි උපකරණ ලබා දීම සිදුකර තිබුණි. බිත්තර නිෂ්පාදක ප්‍රතිලාභීන් විසින් බිත්තර නිෂ්පාදනය පාසල් වලට ලබා නොදී විකුණා තිබීම, කුකුළු පාලනය නතර කර තිබීම, සතුන්ට ආහාර ලබා නොදීම සිදුකර තිබුණි.මේ හේතුවෙන් අවශ්‍ය බිත්තර පාසැල් වලට ලබා දී නොතිබුණි. ඒ අනුව අදාළ ව්‍යාපෘතිය යටතේ 'නිරෝගී ක්‍රියාශීලී දරුපරපුරක්' යන පාසල් පෝෂණ වැඩසටහනින් ඉලක්කගත අරමුණු ඉටු වී නොතිබුණි.

**4.3 ප්‍රසම්පාදනයන්**

(අ) සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව මූලධන වැය විෂයයන් 03 ක් යටතේ ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.16,000,000 ක් වූ අතර අදාල ප්‍රසම්පාදනයන්හි ආරම්භක දිනයන් 2025 මැයි 01 දින හා 2025

පෙබරවාරි 01 දින ද හා අවසාන දිනය 2025 ඔක්තෝබර් 31 දින හා නොවැම්බර් 30 දින වුවද 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඇස්තමේන්තු මුදලින් රු.9,323,119 ක් ඉතිරි වී තිබුණි. ඉතිරිවීමට හේතු වශයෙන් දිට්වා ආපදා තත්ත්වය හේතුවෙන් ප්‍රසම්පාදන කාර්යයන් සම්පූර්ණ කළ නොහැකි වීම දක්වා තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා ප්‍රසම්පාදන අත්පොතෙහි 4.1.3 ජේදය පරිදි සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ නොකිරීම හා 4.1.5 ජේදය පරිදි ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙළ නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන කාර්යයන් සම්පූර්ණ කළ නොහැකි වී තිබුණි.

(ආ) බොරැල්ල සහ පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයට සමාලෝචිත වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ, ලොන්ඩ්‍රි, ආරක්ෂක සහ පිසූ ආහාර සේවා සැපයීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2, 5.2.3 හා 06 හි ඇමුණුම I, ඇමුණුම II, ඇමුණුම III ජේද වලින් බැහැරව කටයුතු කර තිබුණි.

(ඇ) මාතලේ දිස්ත්‍රික්කයට අයත් වැව් හා ඇළ මාර්ග 7 ක ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු. 9,777,650 ක කෘෂි උපකරණ මිලදී ගැනීමට අදාළව 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.9 ජේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.4 පාඩු හා හානි**

(අ) අමාත්‍යාංශයේ ජීප් රථයක් 2014 සැප්තැම්බර් 24 දින පෞද්ගලික කාර්යයන් සඳහා යොදවාගෙන තිබියදී අනතුරට පත්වී වසර 11 කට වැඩි කාලයක සිට දිරාපත් වෙමින් අනාරක්ෂිතව ගාල්කර තිබුණි. මු.රෙ.104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව, මු.රෙ.104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාව ඉදිරිපත් නොකිරීම හා මු.රෙ.105, 106 ප්‍රකාරව කටයුතු සමාලෝචිත වර්ෂය අවසානයටද ඉටුකර නොතිබුණි. අනතුර සිදුවූ අවස්ථාවේ හානිපූර්ණ රක්ෂණ ආවරණ වටිනාකම රු.1,900,000 ක් විය. මු.රෙ.156 (i) (අ) ප්‍රකාරව ප්‍රමාදයක්, නොසැලකිල්ලක්,වරදක් හෝ වංචාවක් හේතු කොට ගෙන රජයට සිදුවූ පාඩුව සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් පෞද්ගලිකව වගකිව යුතු අතර ඉන් සිදුවූ පාඩුව පූර්ණය කළ යුතුද වන අතර ඉහත වාහනය අනතුරට ලක් වී ඇති අවස්ථාවේ රු. 1,900,000 කට රක්ෂණය කර තිබූ ,හානියට පත් එම වත්කම නැවත යථා තත්ත්වයට පත් කිරීම හෝ ඒ හා සමාන වත්කමක් ගොඩනැගිය යුතු බැවින් මුදල් රෙගුලාසි 105 ප්‍රකාරව අදාළ අලාභය සහ දෙපාර්තමේන්තු ගාස්තු ලෙස සියයට 25 ක මුදල ද අයකර ගැනීමට මෙතෙක් වගකිව යුතු පාර්ශව කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ දී අනතුරට ලක් වී තිබුණු ඩබල් කැබ් රථයේ අලාභය රු.424,340 ක් 2021 පෙබරවාරි 25 දින නීතිපති දෙපාර්තමේන්තුන්තුවෙන් එවකට සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා ව්‍යාවහාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යොමු කරමින් නඩු පැවරීමකින් තොරව රියදුරුගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස දක්වා තිබුණ ද මෙම වාර්තාවේ දිනය දක්වා එම මුදල අයකර ගැනීමට වගකිව යුතු පාර්ශව කටයුතු කර නොතිබුණි.

**4.5 කළමනාකරණ දුර්වලතා**

දිළිඳුකම පිටුදැකීමේ අරමුණින් රාජ්‍ය, පෞද්ගලික හා මහජන සම්බන්ධීකරණය සඳහා වන වැඩපිළිවෙලක් වශයෙන් 2017 -2019 කාලය තුළ ග්‍රාම ශක්ති කාර්යාංශය ස්ථාපිත කර ග්‍රාම ශක්ති වැඩසටහන ආරම්භකර තිබුණි. ග්‍රාම නිලධාරී වසම් 14,022 ම ආවරණය වන ලෙස අදියර 1 සහ 2 යටතේ රාජ්‍ය අනුග්‍රහය ඇතිව නඟා සිටුවිය හැකි පවුල් වැඩි ප්‍රතිශතයක සහභාගීත්වයෙන් ග්‍රාම ශක්ති සමිති 3618 ක් පිහිටුවා තිබුණු අතර ඉන් 3,500ක් සමිති ආඥා පනතේ (123 වෙනි අධිකාරය) 6(3) වගන්තිය යටතේ ලියාපදිංචි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

8

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(i) අක්‍රිය ග්‍රාම ශක්ති සමිති සතු වූ මුළු අරමුදල් ප්‍රමාණය රු.400,965,085 ක් වූ අතර ඉන් රු.376,077,653 ක් රජයේ අරමුදල් විය.

(ii) දිස්ත්‍රික්ක 07ක සමිති 1,162 කින් සමිති 1,015 ක් එනම් සියයට 87 ක් අක්‍රිය වී තිබුණි. එම සමිති වලින් 2026 මාර්තු 31 දින වන විට මුළු අක්‍රිය සමිති ගණන 1,385 ක් විය.

(iii) 2023 නොවැම්බර් 14 දිනැති අංක SDB/GS/DIST-03 /2023 දරන ලිපියෙහි ඡේද අංක 03 හි II, III, හා IV මගින් කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිකුත් කරන ලද අක්‍රීය තත්ත්වයට පත්ව ඇති ග්‍රාම ශක්ති සමිති සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දක්වා තිබුණු අතර එම ලිපිය නිකුත්කර වසර 2ක පමණ කාලයක් ගත වී තිබුණද තවදුරටත් අක්‍රිය සමිති සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2026 මාර්තු 31 දින වන විට ද ග්‍රාමශක්ති වැඩසටහන යටතේ ලබා දී තිබුණු රජයේ අරමුදල් දිස්ත්‍රික්ක 18 ක පවතින අක්‍රිය ග්‍රාමශක්ති සමිති 1,068 ක රු.මිලියන 106 ක් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ පොදු තැන්පතු ගිණුමට බැර නොකර පැවතුන අතර අක්‍රිය සමිති වල දීර්ඝකාලයක් නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. බැර කරන ලද මුදලින් රු.මිලියන 18.35 ක් එක් දිස්ත්‍රික්කයක පමණක් සංවර්ධන කාර්යයන් වෙනුවෙන් යොදවා තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂයේ අනුමත, තථ්‍ය හා පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමෙහි තනතුරු 06 ක්ද ද්විතියික මට්ටමෙහි 696 ක්ද ප්‍රාථමික මට්ටමෙහි තනතුරු 11ක්ද පුරප්පාඩුව පැවතුණි.කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට තනතුරු 04 ක් අනුමත කර තිබුණද පුරප්පාඩු 03ක් පැවතුණි. මෙම තත්ත්වය අමාත්‍යාංශයේ කාර්යසාධනය කෙරෙහි බලපෑමට ඉඩ ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ( වැ.බ ) නිලධාරීන් 02 ක්ද ,සහකාර අධ්‍යක්ෂ 03ක්ද කළමනාකරණ සේවා නිලධාරීන් 07 ක්ද සංවර්ධන නිලධාරී 09 ක්ද , සංවර්ධන නිලධාරී (සමාජ ආරක්ෂණ) 07 ක් එකම සේවා ස්ථානයක අවුරුදු 07ත් 27ත් අතර කාලයක් ස්ථාන මාරුවීම් නොලබා සේවයෙහි යෙදී සිටින අතර ස්ථාන මාරුකිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වී නොතිබුණි.

කේ.කේ. එස්. ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

# පරිච්ඡේදය 04

## කාර්යසාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශන | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100 % - 90 % | 75 % - 89 % | 50 % - 74 % |
| | | | |
| ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් වැළැක්වීම සඳහා සිදු කරන ලද මැදිහත්වීම් ගණන (PWDs) | √ | | |
| සමාජ ගැටළු අවම කිරීම සඳහා පවත්වනු ලබන පර්යේෂණ, පුහුණු, උපදේශන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | | √ | |
| වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කරන ලද මැදිහත්වීම් ගණන | | √ | |
| විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා බඳවාගත් සාමාජිකයින් සංඛ්‍යාව | √ | | |
| ග්‍රාමීය සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ගණන | √ | | |

# පරිච්ඡේදය 05

## තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0 % - 49 % | 50 % -74 % | 75 % - 100% |
| 1) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම(SDG 01) | 1.1) 2030 වනවිට ලෝකයේ සියළුම ස්ථානවල වෙසෙන සියළුම පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාවය තුරන් කිරීම, වර්ථමාන තක්සේරුව අනුව දිනකට ඩොලර් 1.25ට වඩා අඩුවෙන් ආදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ. (1.1) | 1.1.1) ග්‍රාමීය සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ගණන | | | √ |
| | 1.2)පහළ මට්ටමේ අයත් ඇතුළත් ව සියළුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සහ 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමඟින් ආවරණය වී තිබීම. (1.3) | 1.2.1) විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා බඳවාගෙන ඇති සාමාජිකයින් සංඛ්‍යාව | | | √ |
| | | 1.2.2) ස්වයං රැකියා ලාභීන් සඳහා පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | | | √ |
| | 1.3) විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල පවත්නා සියලුම ආකාරයේ දරිද්‍රතාවන් තුරන් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ විශ්වාසය තැබිය හැකි ක්‍රමවේද සම්පාදනය කිරීම සඳහා වැඩිදියුණු කරන ලද සංවර්ධන | 1.3.1) ග්‍රාමීය සංවර්ධන සමිති වල නිලධාරීන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් ගණන | | | √ |
| | | 1.3.2) ග්‍රාම සංවර්ධන වැඩසටහනේ නියැලී සිටින ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් ගණන | | | √ |
| | | 1.3.3) ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ ආර්ථික සවිබලගැන්වීම වැඩිදියුණු කිරීම සඳහා පැවැත්වූ වැඩසටහන් ගණන | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සහගයෝගිතාව ඇතුළු විවිධ වූ මූලාශ්‍රයන් මඟින් සම්පත් ලබාදීම කැපී පෙනෙන ආකාරයෙන් වර්ධනය කිරීම. (1.3) | | | | |
| 2)සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම (SDG 02) | 2.1)2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබාගැනීමට හැකි බව තහවුරු කිරීම. | 2.1.1) ප්‍රතිශතාත්මකව අස්වැද්ද වූ අක්කර ප්‍රමාණය | | | √ |
| | | 2.1.2)ප්‍රතිලාභ ලබා ගත් සිසුන්, ගර්භනි මව්වරුන්, මව්වරුන් ගණන | | √ | |
| | | 2.1.3) ගොවිපොළ සංඛ්‍යාව,පාසල් සංඛ්‍යාව, ශිෂ්‍ය සංඛ්‍යාව ආරම්භ කළ ප්‍රතිශතය | | | √ |
| 3) නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම. (SDG 03) | 3.1)2030 වන විට බෝනොවන රෝග නිසා සිදුවන අකල්මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකක් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනයකිරීම. (3.1) | 3.1.1) මනෝ සමාජීය ගැටළු මත පදනම් වූ කණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගී වූ ප්‍රතිලාභීන් ගණන | | | |
| | 3.2) මූල්‍යමය අවධානමට පත්වීම සඳහා ආරක්ෂණයද ඇතුලත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩුවියදමකින් ලබාගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියළු දෙනාටම ලබාගත හැකිවීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමට හැකිවීම. (3.8) | 3.2.1) වෛද්‍ය ආධාර ලබාගත් ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව | | | √ |
| | | 3.2.2) වැඩිහිටියන් සඳහා පැවැත්වූ වෛද්‍ය කඳවුරු ගණන | | √ | |
| | | 3.2.3) ආරෝග්‍යා වෛද්‍ය ආධාර ලබාගත් වැඩිහිටි පුද්ගලයන් සංඛ්‍යාව | | | √ |
| | | 3.2.4) ආධාරක උපකරණ (ශ්‍රවණාධාර, කණ්ණාඩි) ලබාගත් වැඩිහිටි පුද්ගලයන් සංඛ්‍යාව | | | √ |
| 4)පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක | 4.1) 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට | 4.1.1) සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලැසීම **(SDG 04)** | ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩුමුදලකට ලබාගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනයද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබාගැනීමට හැකිවීම. (4.3) | 4.1.2) වෘත්තීය පුහුණු ආයතන වල සහ තරුණ කණ්ඩායම් වල කුසලතා සංවර්ධනය සඳහා පැවැත්වූ වැඩසටහන් ගණන | | | √ |
| | | 4.1.3) අධ්‍යාපන ආධාර ලබා දුන් ආබාධිත සිසුන් සංඛ්‍යාව | | | √ |
| **5)** සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික ප්‍රවර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම **(SDG 8)** | 5.1) 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී සහ සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම (8.5) | 5.1.1) ස්වයං රැකියා ආධාර ලබාදුන් වැඩිහිටි පුද්ගලයින් සංඛ්‍යාව | | √ | |
| | | 5.1.2) ස්වයං රැකියා ආධාර ලබාදුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | | | √ |
| | | 5.1.3) ආබාධිත පුද්ගලයින්ගේ කුසලතා සංවර්ධනය කෙරූ ආයතන සංඛ්‍යාව | | | √ |
| **6)** නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම. **(SDG 11)** | 6.1) 2030 වනවිට සියලුම දෙනාට ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබාගතහැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම (11.1) | 6.1.1) නිවාස ආධාර ලබාදුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | | | √ |
| | | 6.1.2) නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආධාර ලබාදුන් වැඩිහිටි පුද්ගලයින් සංඛ්‍යාව | | | √ |

## 5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

1. ජාතික ක්‍රියාකාරී සැලසුම් හා පනත් ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධිත ආයතන /අමාත්‍යාංශ සඳහා ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ප්‍රගතිය ගෙන්වා ගැනීමේ දී අසීරුතාවන්ට මුහුණ පෑමට සිදුවීම.
2. වැඩසටහන් සම්බන්ධීකරණය සඳහා නිලධාරීන් හා සම්පත් හිඟ වීම.
3. විෂය දැනුම, පුහුණු අවශ්‍යතා ප්‍රමාණවත් නොවීම
4. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී නූතන තාක්ෂණික ක්‍රම යොදා ගැනීමට නිලධාරීන් දක්වන ඍණාත්මක ආකල්ප, ප්‍රමාණාත්මක භෞතික සම්පත් නොමැති වීම හා නූතන තාක්ෂණික ක්‍රම හා භාවිතයන් පිළිබඳ වැඩිහිටි ප්‍රජාවගේ අවබෝධය අඩු වීම.
5. ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලය හා භෞතික සම්පත් නොමැති විම.
6. ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සඳහා වැඩිහිටි ප්‍රජාව සක්‍රිය ලෙස සම්බන්ධ කර ගැනීමට අපහසු වීම.
7. ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් පවතින ග්‍රාම නිලධාරීවසම් ප්‍රමාණය විශාල බැවින් විෂයය ආවරණය කිරීම සඳහා එක් නිලධාරියකු ප්‍රමාණවත් නොවීම.
8. සැලසුම් කර ගත් පරිදි අක් මුදල් නොලැබීම

# පරිච්ඡේදය 06

## මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | තාවකාලික | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු/අතිරික්ත සංඛ්‍යාව |
| ග්‍රාම සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අංශය | 28 | 20 | 3 | 3 | 544 | 538 | 45 | 35 | 4 | 1 | 624 | 597 | 27 |
| **දෙපාර්තමේන්තු/ ආයතන/ අංශ** | | | | | | | | | | | | | |
| ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය | 6 | 5 | 3 | 2 | 53 | 39 | 6 | 2 | 0 | 0 | 68 | 48 | 20 |
| ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය | 7 | 3 | 2 | 1 | 116 | 101 | 24 | 12 | 0 | 0 | 149 | 117 | 32 |
| ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | 8 | 6 | 17 | 14 | 130 | 87 | 43 | 37 | 0 | 0 | 198 | 144 | 54 |
| ලෝක ආහාර සංවිධානය පිළිබඳ හවුල්කාරිත්ව ලේකම් කාර්යාලය | 10 | 5 | 0 | 0 | 15 | 7 | 6 | 1 | 0 | 0 | 31 | 13 | 18 |
| ජාතික සමාජ සංවර්ධන ආයතනය | 53 | 30 | 9 | 4 | 49 | 34 | 26 | 20 | 0 | 0 | 137 | 88 | 49 |
| ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය | 15 | 11 | 04 | 0 | 74 | 33 | 10 | 2 | 0 | 0 | 103 | 46 | 57 |
| ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය | 4 | 3 | 14 | 10 | 21 | 18 | 11 | 7 | 0 | 0 | 50 | 38 | 12 |
| රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය | 6 | 2 | 0 | 0 | 66 | 54 | 5 | 2 | 0 | 1 | 77 | 59 | 18 |
| එකතුව | **137** | **85** | **52** | **34** | **1068** | **911** | **176** | **118** | **4** | **1** | **1437** | **1150** | **287** |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

මෙම අංශය සඳහා අනුමත වූ කාර්ය මණ්ඩලය 624 ක් විය. 2025.12.31 වන දිනට මෙම අමාත්‍යාංශයේ දැනට සිටින කාර්ය මණ්ඩලය 594 කි. අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණ නොවීම අමාත්‍යාංශයේ අරමුණු සහ ඉලක්ක සපුරාගැනීමේදී බාධාවක් පවතී.

සංඛ්‍යාලේඛන නිලධාරි තනතුර සඳහා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කර ගැනීමට යටත්ව තනතුරු 01 ක් මෙම අමාත්‍යාංශය වෙත අනුමත කර ඇත.

## 6.3 මානව සම්පත් ධාරිතා සංවර්ධනය

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු. මිලි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | ආකල්ප සංවර්ධන බැහැරගත පුහුණු වැඩසටහන (පළමු කණ්ඩායම) | 50 | දින 2 යි. 2025.03.21 දින හා 2025.03.22 දින | 0.217124 | | දේශීය | කාර්යක්ෂම, ඵලදායී හා ගුණාත්මක සේවාවක් සැලසීම සඳහා නිලධාරීන් අභිප්‍රේරණය කිරීම. |
| 2 | 2015 වසරේ සිට ක්‍රියාත්මක නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන (පළමු කණ්ඩායම) | 78 | 2024.04.01 දින පැය 06 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.057095 | | දේශීය | නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ දැනුවත් කිරීම. |
| 3 | 2015 වසරේ සිට ක්‍රියාත්මක නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන (දෙවන කණ්ඩායම) | 51 | 2024.04.28 දින පැය 06 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.00 | | දේශීය | නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ දැනුවත් කිරීම. |
| 4 | ආකල්ප සංවර්ධන බැහැරගත පුහුණු වැඩසටහන (දෙවන කණ්ඩායම) | 48 | දින 2 යි. 2025.05.23 දින හා 2025.05.24 දින | 0.16835 | | දේශීය | කාර්යක්ෂම, ඵලදායී හා ගුණාත්මක සේවාවක් සැලසීම සඳහා නිලධාරීන් අභිප්‍රේරණය කිරීම. |
| 5 | ඒකාබද්ධ සේවයේ කාර්යාල සේවක සේවයේ I, II හා III ශ්‍රේණිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටී නිලධාරීන් හට පවත්වන ලද පුහුණු වැඩසටහන. | 29 | 2024.06.13 දින පැය 03 (ප.ව 1.00 – ප.ව. 4.00) | 0.005515 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 6 | පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම පද්ධතිමය බාධාවන් හඳුනාගැනීම සහ සරල කිරීම හා දූෂණ අවධානම තක්සේරු කිරීම සම්බන්ධයෙන් වන පුහුණු වැඩමුළුව. | 222 | 2025.07.22 දින සිට 2025.07.30 දින දක්වා අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද | 0.045425 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 7 | පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම පද්ධතිමය බාධාවන් හඳුනාගැනීම සහ සරල කිරීම හා දූෂණ අවධානම තක්සේරු කිරීම සම්බන්ධයෙන් වන පුහුණු වැඩමුළුව. | 36 | 2025.07.31 දින සීදුව NISD හා 2025.08.01 දින පිළිමතලාව RDTRI හි පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලද | 0.02073 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 8 | මෝටර් රථයක් භාවිතා කිරීමේ සාමාන්‍ය දැනීම හා යාවත්කාලීන මෝටර් රථ නීති පිළිබඳ පුහුණු වැඩසටහන. | 40 | 2025.08.12 දින පැය 05 (පෙ.ව. 9.30 - ප.ව. 3.30) | 0.0114 | | දේශීය | මෝටර් රථයක් භාවිතා කිරීමේ සාමාන්‍ය දැනුම හා යාවත්කාලීන මෝටර් රථ නීති පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 9 | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 61 | 2025.08.15 දින පැය 03 (පෙ.ව. 9.30 - ප.ව. 12.30) | 0.01176 | | දේශීය | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම පිළිබඳ දැනුම ලබා දීම. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 10 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සේවයේ 3 පන්තියේ නිලධාරින්ගේ පළමු කර්යක්‍ෂමතා කඩඉම් විභාගය ඉලක්ක කර හා අවශ්‍යතාවය ඇති අනිකුත් නිලධාරීන් සඳහා පවත්වන ලද මුදල් රෙගුලාසි පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන | 62 | 2025.09.08 දින පැය 06 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.016561 | | දේශීය | මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 11 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සේවයේ 3 පන්තියේ නිලධාරින්ගේ පළමු කර්යක්‍ෂමතා කඩඉම් විභාගය ඉලක්ක කර හා අවශ්‍යතාවය ඇති අනිකුත් නිලධාරීන් සඳහා පවත්වන ලද ආයතන සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩසටහන | 45 | 2025.09.10 දින පැය 04 (පෙ.ව. 10.30 - ප.ව. 2.30) | 0.011661 | | දේශීය | ආයතන සංග්‍රහය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 12. | අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය දැනුවත් කිරීමේ සහ විගණන විමසුම් සඳහා නිවැරදිව හා විධිමත්ව පිළිතුරු සැපයීම පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන | 56 | 2025.09.15 දින පැය 06 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.026166 | | දේශීය | අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය දැනුවත් කිරීමේ සහ විගණන විමසුම් සඳහා නිවැරදිව හා විධිමත්ව පිළිතුරු සැපයීම පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 13 | අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීමේ එක්දින පුහුණු වැඩසටහන | 47 | 2025.10.10 දින පැය 06 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.011550 | | දේශීය | අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතනවලටනවක පත්වීම් ලද හා ස්ථාන මාරු වීම් ලද නිලධාරීන් හට අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීම. |
| 14 | Distance Learning Centre Ltd. ආයතනය විසින් පවත්වන ලද රජයේ වැටුප් මෘදුකාංග (Government Payroll System) පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන | 3 | 2025.10.28 2025.10.29 දිනයන්හි Distance Learning Centre Ltd. හි දි පවත්වන ලද | 0.045 | | දේශීය | වැටුප් සැකසීම පිළිබඳ මනා දැනුමක් ලැබීම. |
| 15 | විශ්‍රාම යාමට පෙර ඒ සඳහා සූදානම් කිරීමේ සම්මන්ත්‍රණය | 54 | 2025.11.21 දින පැය 04 (පෙ.ව. 9.00 - ප.ව. 1.00) | 0.00 | | දේශීය | පූර්ව විශ්‍රාම දිවිය සැලසුම් කිරීම. |
| 16 | විධායක නිලධාරීන් සඳහා නීති ඩිප්ලෝමා පාඨමාලාව | 2 | වර්ෂ 1 | 0.134 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍ර පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 17 | JICA දැනුම බෙදාගැනීමේ සහයෝගීතා වැඩසටහන - ප්‍රජා පාදක විස්තීර්ණ ප්‍රවේශයක් හරහා ආබාධ සහිත පුද්ගලයින්ගේ සමාජ සහභාගිත්වය | 1 | 2025.01.15 - 2025.02.22 | | යැපීම් දීමනාව 25X15 = ඇ.ඩො. 375<br><br>උණුසුම් ඇඳුම් දීමනාව- පවුම් 75 | විදේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 18 | ලියැං ජියා හේ සිට සමෘද්ධිය කරා - නව යුගයේ චීන සහයෝගිතා පුහුණු වැඩසටහන | 1 | 2025.01.10 - 2025.01.21 | | යැපීම් දීමනාව 25x12 = ඇ.ඩො. 300 | විදේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 19 | සමාජ ආරක්ෂණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ආසියා - පැසිෆික් වැඩමුළුව | 1 | 2025.02.11 - 2025.02.13 | | යැපීම් දීමනාව 25X4 = ඇ.ඩො. 100 | විදේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 20 | සමාජ ආරක්ෂණ දත්ත සහ අධීක්ෂණය පිළිබඳ වැඩමුළුව | 1 | 2025.04.01 - 2025.04.05 | | යැපීම් දීමනාව 25X4 = ඇ.ඩො. 100 | විදේශීය | සමාජ ආරක්ෂණ දත්ත හා අධීක්ෂණය පිළිබඳ දැනුම |
| 21 | NCGG – SLIDA අවබෝධතා ගිවිසුම යටතේ 'ඩිජිටල්කරණය' පිළිබඳ පුහුණු වැඩසටහන. | 1 | 2025.04.20 - 2025.05.03 | | යැපීම් දීමනාව 25x14 = ඇ.ඩො. 350 | විදේශීය | ඩිජිටල්කරණය පිළිබඳ දැනුම |
| 22 | අවිධිමත් අංශයේ ව්‍යවසාය, ව්‍යවසායකත්වය සහ රටේ ආර්ථික සංවර්ධනය | 1 | 2025.05.14 - 2025.05.29 | | යැපීම් දීමනාව 25x15 = ඇ.ඩො. 375 | විදේශීය | ව්‍යාපාර ව්‍යවසායකත්වය සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය පිළිබඳ දැනුම |
| 23 | උණුසුම ඉහළයාම, ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීම: ගෝලීය උණුසුම ඉහළයාම හමුවේ කාන්තාවන් සඳහා විසඳුම්, TA 10127-REG: ආසියානු සහ පැසිෆික් කලාපයේ කාන්තාවන්ගේ තාප ආතතියට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම. | 2 | 2025.06.01 - 2025.06.05 | | යැපීම් දීමනාව 25x04 = 100 25x04 = ඇ.ඩො. 100 | විදේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 24 | දිළිඳු ජනතාවට වැඩි වශයෙන් ප්‍රතිලාභී සහ සියල්ලන් ඇතුළත් වර්ධනය සඳහා වන කඩිනම් ප්‍රශස්ත ක්‍රියාමාර්ග ආරම්භ කිරීම පිළිබඳ දැනුම බෙදාගැනීම. | 1 | 2025.06.23 - 2025.06.27 | | යැපීම් දීමනාව 25x04 = ඇ.ඩො. 100 | විදේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 25 | බිහාර් රජයේ සතත් ජීවිකෝපර්ජන් යොජනා (SJY) වැඩසටහන බලගැන්වීමේ කණ්ඩායම සඳහා ප්‍රායෝගික සහ ඉගෙනීමේ චාරිකාව | 1 | 2025.07.28 - 2025.08.01 | | යැපීම් දීමනාව 25x6 = ඇ.ඩො. 150 | විදේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 26 | දිළිඳු ජනතාවට වැඩි වශයෙන් ප්‍රතිලාභී සහ සියල්ලන් ඇතුළත් වර්ධනය සඳහා වන කඩිනම් ප්‍රශස්ත ක්‍රියාමාර්ග ආරම්භ කිරීම පිළිබඳ දැනුම බෙදාගැනීම. | 1 | 2025.07.27 - 2025.08.09 | | යැපීම් දීමනාව 25x13 = ඇ.ඩො. 325<br><br>උණුසුම් ඇඳුම් දීමනාව- පවුම් 75 | විදේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 27 | Delivering for Nutrition in South Asia : Towards Impact at Scale සමුළුව ඇමතීම | 1 | 2025.12.01 - 2025.12.05 | | යැපීම් දීමනාව 40 x 04 = ඇ.ඩො. 160<br><br>උණුසුම් ඇඳුම් දීමනාව - පවුම් 75 | විදේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |

****ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

මෙම අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතන වෙත පැවරී ඇති කාර්යභාරයන් අතර ප්‍රමුඛතම කාර්යය වන්නේ දිවයිනේ ආර්ථික,සමාජයීය, කායිකහා මානසික වශයෙන් පසුගාමී තත්ත්වයෙන් පසුවන අවාසි සහගත තත්ත්වයන්හී දිවි ගෙවන ජන කණ්ඩායම් ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා අධ්‍යාත්මික වශයෙන් සවිබලගන්වා ඔවුන් හට ඉහළ ජීවන තත්ත්වයක් අත්කර දීමට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීමයි.

මෙම කාර්යභාරය සාක්‍ෂාත් කිරීම පිණිස අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම් අංශයේ හා අනුබද්ධ ආයතන සතු මානව සම්පත විෂයානුබද්ධ හා තාක්‍ෂණික දැනුමෙන් බලගැන්විය යුතු අතර ඊට සමාන්තරව සිය වගකීම් නිසියාකාරව ඉටු කිරීමට පෙළඹවීම සඳහා නිසි මඟ පෙන්වීම් සහිත ආකල්ප වර්ධන වැඩසටහන්වලට නිරන්තරයෙන් යොමුකළ යුතුය.

එම අරමුණු පෙරදැරිව ක්‍රියාත්මක කරන ලද ඉහත සඳහන් පුහුණු වැඩසටහන් විශයානුබද්ධව හා තාක්ෂණික දැනුමින් දැනුවත් කිරීම හා ආකල්ප සංවර්ධනය කිරීම මඟින් ඉහත ජන කණ්ඩායම් හට ඵලදායී සේවයක් සැලසීම සඳහා නිලධාරීන් තුළ මානසික අභිප්‍රේරණයක් ඇතිවන අතර අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්ය සාධනය ඉහළ නැවීම උදෙසා එමඟින් විශාල දායකත්වයක් සපයනු ලබයි.

# පරිච්ඡේදය 07

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| **1.1** | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| **1.2** | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| **1.3** | ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| **1.4** | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| **1.5** | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| **1.6** | වෙනත් | - | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| **2.1** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.2** | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.3** | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.4** | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.5** | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **2.6** | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.7** | ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.8** | තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.9** | හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.10** | බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.11** | උප පත්‍රිකා පොත් ලේඛණය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභි නියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| **3.1** | මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| **3.2** | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/204 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | යොමු කරනු ලබන බෙහොමයක් විගණන විමසුම් සඳහා මසක් අතුළත පිළිතුරු ලබා නොදීම | අභ්‍යන්තර විගණන විමසුම් සදහා මසක් ඇතුළත පිළිතුර යොමු කරන ලෙස ආයතන හා අංශ ප්‍රධානින් දැනුවත් කිරීම |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| **8.1** | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **8.2** | ඉහත සඳහන් චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| **8.3** | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **8.4** | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| **8.5** | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාරණය** | | | |
| **9.1** | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **9.2** | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| **9.3** | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **9.4** | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **9.5** | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| **9.6** | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අදාළ නොවේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| **10.1** | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **10.2** | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **10.3** | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| **11.1** | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| **11.2** | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| **12.1** | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කිලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛණයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **18.2** | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | **අනුකූල වේ** | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| **19.1** | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | **අනුකූල වේ** | | |
| **19.2** | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | **අනුකූල වේ** | | |
| **19.3** | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | **අනුකූල වේ** | | |
| **19.4** | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් තොට තිබීම | **අනුකූල වේ** | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| **20.1** | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | **අනුකූල වේ** | | |